# නියමුවා

පාර්ලිමේන්තුවාදයෙන් ගොඩ ඒමට නම්, ඇත්ත වශයෙන්ම නියෝජිතයින් තෝරා පත් කිරීමේ ආයතන සහ ඡන්ද අයිතිය පිළිබඳ මූලධර්මය විනාශ කර දැමිය යුතු නැත. එහෙත් තෝරා පත් කරන නියෝජිතයින්ගෙන් යුත් ආයතන කථා මඩුවලට සීමා නොකොට ඒවා 'ක්‍රියාකාරී 'ආයතන බවට පත් කළ යුතුය."

ලෙනින්

රජය හා විප්ලවය, 52 පිටුව

ISSN 1391 - 1031 | 2023 ජනවාරි | 27 වෙළුම | 08 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=




# ජනමතය සමග ගේම් එපා

# ඡන්ද කල් තැබීමේ කුමන්ත්‍රණ

# පරාජය කරනවා

## ජනතා විමුක්ති පෙරමුණ

ආණ්ඩුව විවිධ හේතු දක්වමින් පළාත් පාලන මැතිවරණය කල් දැමීමට උත්සාහ කරන බවට චෝදනා කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, ජනතාවගේ ජනමතය සමග විවිධාකාරයේ ගේම්, සූදු, සෙල්ලම් කිරීමට සූදානම් නොවන ලෙසත් එවැනි සියලු ආකාරයේ කුමන්ත්‍රණකාරී උත්සාහයන් පරාජය කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සූදානම් බවත් ආණ්ඩුවට අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 30වැනි දින පස්වරුවේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

" පළාත් පාලන මැතිවරණය හෝ වෙනත් කවර හෝ මැතිවරණයක් පැවැත්වීමෙන් ජනාධිපතිවරයාට ඔහු පිළිබඳව තක්සේරුවත් පොහොට්ටුවට තිබෙන තක්සේරුවත් ජනතාව විසින්ම පෙන්වා දෙනවා. එවැනි තත්වයක් තුළ එතැන් සිට ආණ්ඩුවට ඉදිරියට යන්න බැහැ. ජනවරමක් නැති බව පැහැදිලිවම සනාථ වෙනවා. ඒ නිසා ඒ ඇත්ත ජනමතය ප්‍රකාශයට පත්වීම වැළැක්වීම සඳහා ආණ්ඩුව විවිධ උපක්‍රම සූක්ෂමව ක්‍රියාත්මක කරමින් සිටිනවා.

සැප්තැම්බර් 20 සිට ජනවාරි 09 දක්වා කාලය තුළ ඕනෑම දිනයකදී මැතිවරණය ප්‍රකාශයට පත්කළ හැකි වුවත් එය අන්තිම මොහොත දක්වාම ඇදගෙන ගියා. සීමා නිර්ණය, මන්ත්‍රීවරුන් සංඛ්‍යාව අඩු කිරීම, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම වැනි විවිධ නීතිමය උපක්‍රම මැතිවරණය කල් දමා ගැනීමට යොදාගන්න උත්සාහ කළා. ඒ තුළින් මැතිවරණ කොමිසම බිත්තියට හේත්තු වීම දක්වා ඇවිත් තිබෙනවා. නැවත කල් දැමීමක් කරන්න බැහැ. නමුත් නාම යෝජනා බාරගෙන ඡන්දය කල් දැමීමේ උත්සාහයක් ගැන නැවත කසුකුසුවක් යනවා. ජනතාවගේ ජනමතය එක්ක විවිධාකාරයේ ගේම්, සූදු, සෙල්ලම් කරන්න ලැහැස්ති වෙන්න එපා කියලා රනිල් වික්‍රමසිංහටත් ආණ්ඩුවටත් අපි අවධාරණය කරනවා. මේ ඉන්නේ පාර්ලිමේන්තුවටවත් එන්න බැරිව පලවා හැරි නායකයෙක්; රාජපක්ෂලාගේ පාර්ලිමේන්තුවේ 134කගේ කැමැත්තෙන් රාජපක්ෂලාගේ ආරක්ෂාව වෙනුවෙන් පත්කරගත් නායකයෙක්. ජනතාවගේ නියෝජිතයන් පත්කර ගැනීමේ අවස්ථාව අහුරන්න මෙවැනි නායකයෙකුට අපි කිසි සේත්ම ඉඩ නොදෙන බව සහතික කරනවා.

මැතිවරණය කල් දැමීමට මෙතෙක් දැරූ සියලු ප්‍රයත්න පරාජය කර තිබෙනවා වගේම නාමයෝජනා කැඳවීමෙන් පස්සේ එවැනි දේකට සූදානම් වුණොත් අනිවාර්යයෙන්ම පරාජය කරනවා. පැරණි සාම්ප්‍රදායික විනාශකාරී කඳවුරුවලින් අපේ රටට කළ හැකි සියලුම විනාශයන් සිදුකර අවසන්. කඩා වට්ටපු ආර්ථිකයන් ගොඩගෙන තිබෙන්නේ ජනතාවගේ වරම සහිත පාලනයන් පමණයි. කඩාවට්ටපු අය කවදාවත් ආර්ථිකයන් ගොඩගෙන නැහැ. සෝමාලියාවේ මුහුදු මංකොල්ලකාරයෝ නැවක් අල්ලගත්තා වගේ ව්‍යවස්ථාවේ වගන්ති කිහිපයකට මුවාවෙලා පාලනයේ ඉන්න කල්ලියක් රටක් අල්ලා ගත්තාම රටේ අර්බුද තවත් තීව්‍ර වෙනවා විතරයි.

අර්බුදයෙන් ගොඩඑන්න නම් නව ආණ්ඩුවක් අවශ්‍ය බව ජනතාව තීරණය කරන්න ඕනෑ. ඒ නිසා නව පාලනයකට අවශ්‍ය දොරටු විවෘත කරන පළමු පිම්ම පනින්න ජනතාව පෙළගැසෙයි කියලා අපි අපේක්ෂා කරනවා. ඒ මැතිවරණය දිනා ගැනීම වෙනුවෙන් අපි සියලු කටයුතු සිදුකරන්න සූදානම්.

03

### ලොකු පෙරළි කළ හැකි...

රනිල්-රාජපක්ෂලා පුංචි ඡන්දයට මෙතරම් බියවී සිටින්නේ ඇයි? හේතුව ඉතා පැහැදිලිය. පුංචි ඡන්දය ඔවුනට මාරාන්තිකය. ඉන් ඔවුන්ගේ පාලනයේ අවසානය සනිටුහන් වේ. එසේම මාලිමාවේ ජයග්‍රහණය ප්‍රකාශවීමද ඉන් සිදුවේ. රනිල්ගේ බිය දෙගුණ තෙගුණ වන්නේ...



05

### මේ රට ජයග්‍රහණය කරා...

පළාත් පාලන මැතිවරණයෙන් ආණ්ඩුවට ජන මතයක් නැති බව ඔප්පු වූ මොහොතේ සිටම රටේ දේශපාලනය විශාල වශයෙන් වෙනස්වීම ආරම්භ වෙනවා. ව්‍යවස්ථාව පෙන්වමින් තවත් අවුරුදු දෙකක් බලයේ සිටීමට ආණ්ඩුවට...



09

### සමාජ වෙළඳපොළ ආර්ථිකය...

ජනතාවගෙන් දිනපතා ප්‍රතික්ෂේප වෙමින් සිටින ධනපති පාලකයින් ජනතාව තව දිනයක් හෝ රවටා බලයේ සිටීම සඳහා තමන් මෙතෙක් කර තබාගෙන පැමිණි ධනවාදී ආර්ථික ක්‍රමයම කොතරම් දිරාපත් වෙමින්...



තරුණ.................................. 04
ජාත්‍යන්තර........................ 06
ආ.ර්ථිකය .......................... 07
කාන්තා............................... 08
විශේෂාංග........................ 10
වේදිකාව............................11

යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# සටන් බිම

## බණිජ තෙල් සංස්ථාව රැකගන්නෙ කෙසේද? බණිජ තෙල් සේවකයින්ට දේශනයක්



'බණිජ තෙල් සම්පතේ හෙට දවස, රටේ ආර්ථිකය සහ අපේ අනාගතය' මැයෙන් බණිජ තෙල් සේවක එකතුව මගින් කොළොන්නාව මංගලපාය ශාලාවේදී විශේෂ රැස්වීමක් පැවැත්වූ අතර ඒ සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයා සහභාගි විය. ලංකා බණිජ තෙල් සංස්ථා සේවක සංගමයේ සභාපති අශෝක රංවල ඇතුළු තෙල් සංස්ථාවේ සේවකයින් විශාල පිරිසක් මේ සඳහා එක්වී සිටියහ. මෙහිදී ලාල්කාන්ත සහෝදරයා අදහස් දක්වමින් ප්‍රකාශ කළේ රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තියම වී ඇත්තේ ඉතුරු වී ඇති සියල්ල විකුණා ඩොලර් ලබාගැනීම බවය. මෙම පාලකයින් පලවා හැර නව ජනතාවාදී පාලනයක් මගින් මෙම ආර්ථික අර්බුදයට විසඳුම් ලබා දිය යුතුව ඇති බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

## සමස්ත ලංකා සුවසේවා සංගමයේ 24වැනි සමුළුව මුළුදෙයි



සෞඛ්‍ය සේවක අයිතීන් දිනාගැනීමට, නිදහස් සෞඛ්‍ය සේවය සුරැකීමට, වැඩකරන ජනතා බලයක් ගොඩනැගීමට බලකරන සමස්ත ලංකා සුවසේවා සංගමයේ 24 වන වාර්ෂික සමුළුව පසුගියදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සමස්ත ලංකා සුවසේවා සංගමයේ සභාපති සමන්ත කෝරළේආරච්චි, ලේකම් මහින්ද ගුරුගේ ඇතුළු වෘත්තීය සමිති නායකයින් හා සාමාජිකයින් විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම සමුළුව පවත්වනු ලැබිණි.

## වෘත්තීය අයිතීන් කප්පාදුවට විරෝධය



රාජ්‍ය සේවා කොමිසම විසින් ඉදිරිපත් කරන ලද නව ගැසට් නිවේදනය අනුව වෘත්තීය සමිති අයිතීන් කප්පාදු කර ඇති බවට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය චෝදනා කරයි. විශේෂයෙන් මීට ප්‍රථම වෘත්තීය සමිතිවලට හිමිව තිබූ සාමාජිකත්වය 1000ට වඩා වැඩි වීමේදී වෘත්තීය සමිති සාමාජිකයෙක් නිදහස් කිරීමේ ක්‍රියාවලිය මේ මගින් කප්පාදු වී ඇතැයි ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය. මෙම වෘත්තීය සමිතිවලට හා සාමාජිකයින්ට ලැබී ඇති අයිතීන් මෙම 74 වසර තුළ පාලකයින් දෝතින් ලබා දී ඇති අයිතීන් නොවන බවත් එය සටන් කර දිනාගැනීමෙන් ලබා ගත් ජයග්‍රහණ බවත් පැවසූ චන්දන සූරියආරච්චි සහෝදරයා එය රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ වුවමනාවන් වෙනුවෙන් මෙම අයිතීන් නැති කිරීමට ඉඩ ලබා නොදෙන බවට අවධාරණය කළේය. මෙම තත්වය වහා නිවැරදි නොකළහොත් සමස්ත වැඩකරන ජනතාව සමග පාරට බැසීමට සූදානම් යැයි චන්දන සූරියආරච්චි සහෝදරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

## බලාගාර විකිණීමට එරෙහිව නොරොච්චෝලේදී විරෝධතා




දේශීය සම්පත් විකුණා දැමීමේ ආණ්ඩුවේ වැඩපිළිවෙලට අනුව විදුලි බලාගාර විකුණා දැමීමට සහ විදුලි බිල විශාල අගයකින් වැඩිකිරීමට එරෙහිව ලංකා විදුලි සේවක සංගමය, විදුලි ඉංජිනේරු සංගමය ඇතුළු වෘත්තීය සමිති පසුගියදා නොරොච්චෝල විදුලි බලාගාරය ඉදිරිපිට දැවැන්ත විරෝධතාවයක් පැවැත්වීය. එහිදී ඔවුන් පැවසුවේ නොරොච්චෝලේ බලාගාරය විකුණා දැමීමෙන් මෙගාවොට් 900ක විදුලි ධාරිතාවක් විදුලි බල මණ්ඩලයට අහිමි වන බවය. එසේම 70-80% කින් විදුලි බිල නැංවීම මගින් රටේ ජනතාවට විදුලිය ලබාගැනීම දැඩි අර්බුදයකට යවන බවත් විමලසුරේන්ද්‍ර බලාගාරයද විකිණීමට කටයුතු කරමින් ඇති බවත් සම්ප්‍රේෂණ පද්ධතිය දෙකඩ කොට සමාගම්වලට විකිණීමට කටයුතු යොදා ඇති බවත් ආණ්ඩුවේ මෙම විකිණීමේ වැඩපිළිවෙල පරාජය කිරීමට කටයුතු කළ යුතුව ඇති බවත් ලංකා විදුලි සේවක සංගමයේ ලේකම් රංජන් ජයලාල් සහෝදරයා මෙහිදී පැවසීය.

*ඉතාලියේ ශ්‍රී ලාංකිකයන් සමග දෙසැම්බර් 10වැනි දින නාපොලි නගරයේ පැවති හමුව*

## රට ගොඩනැගීමේදී විදෙස්ගත ශ්‍රමිකයන්ට විශාල කාර්යභාරයක් තිබෙනවා

ජාතික ජන බලවේගයේ නායක
**අනුර දිසානායක සහෝදරයා**



ඉතාලියේ සිටින ඔබ ලංකාව සුන්දර රටක් වේ යැයි ප්‍රාර්ථනයකින් කටයුතු කරන බව අපි දන්නවා. මෙයට පෙර අප සමග කටයුතු කළ අයත්, වෙනත් දේශපාලන ව්‍යාපාර සමග සම්බන්ධවී කටයුතු කළ අයත් විශාල පිරිසක් මෙතැන සිටින බව මම දන්නවා. අපේ රට ගමන් කරමින් තිබෙන මාවතින් වෙනස් කළ යුතුයි කියන එක අපි සැමදෙනෙක්ම දන්නවා. මේ මාවතේ ඉදිරිය විනාශකාරී අන්තයක් මිස සුබදායක එකක් නොවෙයි. අපේ රටේ දැන් පවතින අර්බුදය ආර්ථිකයට ලඝු කරන්න බොහෝ අය උත්සාහ කරනවා. නමුත් එහි පතුලේ තිබෙන්නේ දේශපාලන සංස්කෘතිය. ඒ නිසා අනුගමනය කරමින් තිබෙන දේශපාලන සංස්කෘතියත් ආර්ථිකයත් දෙකම එකට ගෙන වෙනස් කිරීමේ අභියෝගය ජාතික ජන බලවේගය බාරගන්න සූදානම්.

මම ලංකාවෙන් පිටත් වුණේ අයවැය විවාදය අවසන්වීමත් සමග. පාර්ලිමේන්තුවේ මේ අයවැය ජයග්‍රහණය කළත්, රට තුළ, ජනතාව අතර එය ජයග්‍රහණය කරන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ නියෝජනය කරන්නේ ජනතාවගේ ඇත්ත මතය නොවෙයි. එවැනි පාර්ලිමේන්තුවක් වෙනුවට ජනතාවගේ ඇත්ත මතය, වුවමනාවන් නියෝජනය කරන පාර්ලිමේන්තුවක් පත්කර ගන්න ඕනෑ.

රටක ආරක්ෂාව රඳා පවතින්නේ ඒ රට කොතරම් ආර්ථික අතින් ශක්තිමත්ද කියන සාධකය මත. රට දුප්පත් වුණාට පාලකයන් පොහොසත් වී ගිණුම් උතුරා යනවා. සෞඛ්‍යයට, අධ්‍යාපනයට, කර්මාන්තශාලා ඇති කිරීමට සහ රැකියා ඇති කිරීමට යෙදවිය හැකි ධනය ඉතා කුඩා කණ්ඩායමක් විසින් කොල්ලකා තිබෙනවා. අපි සියලු දෙනා එකතු වී මේ චෞර වළල්ලෙන් රට මුදා ගත යුතුයි. දෙපිරිසක් විදිහට බෙදී සිටින මේ පක්ෂ දෙකක් නැහැ. ඔවුන් එක පෙරමුණක්. පසුගිය ජනාධිපතිවරණයේදී ගෝඨාභය රාජපක්ෂ බලයට පත්කිරීම වෙනුවෙන් ඡන්දය දෙන්න ඉතාලියේ සිට ගිය පිරිසකුත් ඉන්නවා. සැමදෙනෙක්ම බලාපොරොත්තු වුණේ රට ගොඩගැනීම වෙත සුබවාදී ආකල්පයන්.

රනිල් වික්‍රමසිංහ පළවා හැර ගෝඨාභයට ඡන්දය දන්නා. නමුත් දැන් සිද්ධ වෙලා තිබෙන්නේ ගෙදර යැවූ රනිල් වික්‍රමසිංහට රාජපක්ෂලාගේ ගැලවුම්කරුවා වශයෙන් පාලනය ලබාදීමයි. මේ දෙගොල්ල එකම පිරිසක් බව තහවුරු කරන්න ඕනෑවටත් වැඩිය කරුණු තිබෙනවා. රාජපක්ෂලා අමාරුවේ වැටුණු වෙලාවේ රනිල් වික්‍රමසිංහ ඒ හැමදෙනාම බේරා ගත්තා. ඒගොල්ලෝ එකම කණ්ඩායමක් හැටියට ඉන්න අතරේ අපේ පංතියේ ජනතාව බෙදී රණ්ඩු වෙනවා. නමුත් ඒ ගොල්ලෝ කවදාවත්ම නොබෙදී සිංහල, දෙමළ, මුස්ලිම් හැටියට වගේම ආගම් හැටියට බෙදා වෙන්කරමින් තිබෙනවා. නමුත් අපි සියලු දෙනා එක කණ්ඩායමකට එකතු වී ඔවුන් පළවා හැරිය යුතුයි.

ජනතාව විසින් පළවා හැරි රනිල් වික්‍රමසිංහ, සියල්ල දන්නා ලෙස පෙනී සිටින සජිත් වගේ අයට තවදුරටත් ජනතාව රැවටිය නොහැකියි. නීතිඥ සංවිධාන, අපේ ආරක්ෂක සංවිධාන, ලංකාවේ ඇත්ත ව්‍යවසායකයින් හඳුන්වාදීම් ජනවාරි මාසයේදී සිදුකරනවා. රටට සිදුවී තිබෙන විනාශය පිළිබඳ අවබෝධයකින් යුතු පිරිස එකතු වී රට ගොඩනැගීමට පෙළගැස්වීමයි දේශපාලනය කියන්නේ. ජාතික ජන බලවේගය රටට සිදුවී තිබෙන විනාශය ගැන ඒ විනාශයේ දිග පළල ගැන එයින් ගොඩඒමේ මාවත ගැන ජනතාව සමග සංවාදයේ යෙදෙනවා. මේ කාර්යයේදී විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට විශාල වැඩකොටසක් පැවරී තිබෙනවා.

ඉතාලියේ ජීවත්වන ඔබ ජාතික ජන බලවේගයේ කොඩිය ඉහළින් එසෙව්වොත් එය ඔබේ ගමට ගෙනයන ලොකුම පණිවිඩය වෙනවා. ගෝඨාභය රාජපක්ෂගේ රැල්ල නිර්මාණය කළේ විදෙස්ගත ශ්‍රී ලාංකිකයින්. මේ නාපොලි නගරයේ ඒකරාශී වී සිටින පිරිස දකිනකොට සුළං හමන දිසාව ගැන අවබෝධ කර ගන්න පුළුවන්. අපි අංශ කිහිපයකින් වෙනස් කිරීම පටන් ගන්නවා. විධායක ජනාධිපති ධුරය වෙනුවට පාර්ලිමේන්තුවට බලය පැවරෙන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වා දෙනවා. ඒ වගේම පිල් පනින දේශපාලන සංස්කෘතිය අවසන් කිරීමේ වගන්ති ව්‍යවස්ථාවට ගේනවා. ඇමති මණ්ඩලය ව්‍යවස්ථාවෙන්ම සීමා කරනවා. වංචා දූෂණ නතර කිරීම වෙනුවෙන් දඬුවම් කිරීමත්, හොරා කාපු දේපොළ නැවත පවරා ගැනීමත් සිදුකරනවා.

රට ගොඩනැගීම සඳහා අවංකව කැපවන පිරිසක් සිටින්නේ, ධෛර්යයක් තිබෙන මිනිසුන් සිටින්නේ ජාතික ජන බලවේගයේ විතරයි. තනි මිනිසුන්ගේ පාලනය වෙනුවට සාමූහික පාලනයක් ගෙනයන වෙනස්කම අපි සිදුකරනවා. සියලු දෙනා ඒකාබද්ධ වුණු යාන්ත්‍රණයකින් කෙටි කාලයක් තුළ රට ගොඩනැගීම කළ හැකියි. විදෙස්ගත ලාංකිකයින් උපයාගෙන තිබෙන ධනය රට ගොඩනැගීම වෙනුවෙන් ආයෝජනය කරන්න සියලු පහසුකම් දෙන ආර්ථික වෙනස්කම් ජාතික ජන බලවේගය සිදුකරනවා. අපිට ක්ෂණිකව අවශ්‍ය ඩොලර් ලබාගැනීමට විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගෙන් විශාල දායකත්වයක් බලාපොරොත්තු වෙනවා. ඒ වෙනුවෙන් විශ්වාසවන්ත පාලනයක් අපි බිහිකරනවා. ඔබ රටට එවන හැම ඩොලරයක්ම ආයෝජනය ආකාරය අන්තර්ජාලයට එකතු කරනවා. දැන් ඔබ යවන ඩොලර්වලට ඔවුන් ලෝකයේ තිබෙන හොඳම වාහන පාවිච්චි කරනවා. අපේ පාලනයක් තුළ ඔබ යවන හැම ඩොලරයකටම වගකීමක් තහවුරු කරනවා. මේ මූලික වෙනස්කම් කරමින් රට ගොඩනැගිය හැක්කේ ජාතික ජන බලවේගයට පමණයි. ඒ ගොඩනැගීමේ ක්‍රියාවලියේදී විදෙස්ගත ශ්‍රමිකයන්ට පැවරී තිබෙන කාර්යභාරය වෙනුවෙන් අපි හැමදෙනාම අත්වැල් බැඳගනිමු.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# 2023 ඉතිහාසය අලුතින් ලියන වසරක් කරමු!

දින දර්ශනයට අනුව උදාවෙන 2023 වසර අපේ රටේ හැම අතින්ම තීරණාත්මක වසරක් වනු ඇතැයි අපි සිතමු.

2022 ගෙවී ගියේ අර්බුද, අරගල, ජනතා නැගිටීම්ල පාලකයන් පලවා හැරීම් වැනි සිදුවීම් බහුල වසරක් ලෙසය. දැන් 2023 උදාවන්නේ එකී අත්දැකීම්ද තවමත් නොවිසඳුණු දැවැන්ත අර්බුදයන්ද දරාගෙනය. වසර 75ක් තිස්සේ ගොඩගැසුණු, වර්ධනය වුණු සියලු අර්බුද අවසන් කර, පැරණි විනාශකාරී ඉතිහාසයන් වෙනස් කර, අලුතින් ඉතාහාසය ලිවීමට පසුගිය වසරේ සටන්වලින් ඉගෙනගත් පාඩම් අතිශය වැදගත් වනු ඇත.

අප සැම පෙළෙන අර්බුදයේ දිග පළල තේරුම්ගෙන, එම අර්බුදයේ නිර්මාතෘවරුන් හඳුනාගෙන, මේ රට මේ අගාධයෙන් ගොඩගැනීමට ඔවුනට නොහැකි බවත් වටහාගෙන, 75 වසරක වැරදි දේශපාලන ගමනට අවසන් තිත තබා ඉතිහාසය අලුතින් ලිවීමට අධිෂ්ඨානයෙන් පෙළගැසෙන මෙරට ජනතාවට පළමුවෙන්ම මෙම වසර සිහින දිනන සුබ නව වසරක් වේවායි සුබ පතමු!

වසර 75ක දූෂිත දේශපාලනය ලංකාව ඇද දමා ඇත්තේ නරා වළකටය. රටේ ආර්ථිකය කාබාසිනියා කර ඇත. එක් පුරවැසියෙක් රුපියල් ලක්ෂ 12ක ණයකාරයෙක් වන සේ රට ණය උගුලක හිරකර ලෝකය හමුවේ අවමානයට පත්කර ඇත.

සමාජය අනාරක්ෂිත කර ඇත. පාසල් තුළට මත්ද්‍රව්‍ය රැගෙන එන මට්ටමට කළු ආර්ථිකය බලවත්ව ඇත. 1978න් පසු නිර්මාණය වූ ‘බල්ලො මරා හරි සල්ලි සෙවීමේ’ චින්තනය, රටක්, සමාජයක්, දරු පරපුරක් වනසන නරුම තලයකට ගෙනවිත් ඇත.

පැරණි දේශපාලනයත්, එහි දේශපාලකයෝත් පිරිහී කුණුවී, ගඳගසන තත්වයට පත්ව සිටිති. පොදුවේ ගත් කල ලංකාවේ ධනවාදය දැන් මියගොස්ය. විටින් විට අපට දැනෙන්නේ එහි දුගඳය. එයට සුවඳ විලවුන්, පවුඩර් දමා, කල්තබා ගැනීමට කොතරම් උත්සාහ කළත් කුණුවී ඕජස් ගලන එයින් එන දුගඳ නැවතිය නොහැක. රටම ගඳ ගස්වන, පරිසරයම දූෂණය කරවන මේ මළකුණ වළ දමා නව උපතකට අවස්ථාව දිය යුත්තේ මේ නිසාය.

ප්‍රභූ පැලැන්තියේ නායකයන්, වලව්කාරයන්, ඔවුන් වටා රොද බැඳගත් දූෂිතයන්, ජාවාරම්කරුවන්, මැරයන් එක්ව වසර 75ක් තිස්සේ ලියූ ඉතිහාසය විසින් ජනතාව රැගෙනවිත් ඇත්තේ ඛේදවාචකයක් වෙතය. එය දිනපතා ගමන්කරමින් සිටින්නේ අඳුරු අගාධයක් කරාය. එම ගමන දැන් නැවැත්විය යුතුය. ඉතිහාසය වෙනස් කර යළි ලිවිය යුතුය. එයට තවත් කල් බැලිය නොහැක.

අපේ රටේ ඉතිහාසය අලුතින් ලිවීමේ වගකීම බාරගත යුත්තේ පොදු ජනතාවමය. පැවති ධනේශ්වර පාලනයෙන් පීඩාවට පත් සමස්ත ජනයා ඒ සඳහා එකතු විය යුතුය; පෙරමුණ ගත යුතුය. දුගී බවේ පත්ලට ඇදවැටුණු, පීඩාවට පත්වුණු ගොවි ජනයාද, ජීවත්වීම අරගලයක් වූ වැඩකරන ජනයාද, ධීවරයන්ද, මානව ගරුත්වයද අහිමි කළ පීඩිත කාන්තාවන්ද, අනාගතය අහිමි කළ තරුණයන්ද, නව ලොවක් පතන කලාකරුවන්, වෘත්තිකයන්, ව්‍යාපාරිකයන්, නිෂ්පාදකයන්, උගතුන්, බුද්ධිමතුන් වැනි ප්‍රගතිශීලී සියලු බලවේගද මෙම මහා පොදු ජන ප්‍රවාහය නියෝජනය කළ යුතුය.

ඉතිහාසය ගොඩනඟන්නේ තනි වීරයන් නොවේ. මැවුම්කරුවන් නොවේ. අධිෂ්ඨාන සහගත ජනතාවන්ය. සත්‍යය එයයි. දැන් එම ජනතාවගේ කාලය එළඹ තිබේ.

බලය අහිමිවීම පිළිබඳව බියෙන් තැති ගැන්වී සිටින, ජනතාවට විනාශය ගෙන ඒමට දායක වූ සියලු දෙනා බියෙන් සලිතව සිදු කරන අවලාදවලට, අපහාසවලට, කූට උපක්‍රමවලට හසු නොවී අප සැම එක්ව මෙරට ඉතිහාසය අලුතින් ලිවිය යුතුය.

සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සෑම දෙනාමද, සියලු ආගම් අදහන සෑම දෙනාමද සමගියෙන් එක්වී, සියලු වැරදි බෙදුම් රේඛා මකා දමා ප්‍රතිගාමීත්වය හා ප්‍රගතිශීලීත්වය අතර අයුක්තිය හා යුක්තිය අතර, අසාධාරණය හා සාධාරණය අතර ම්ලේච්ඡත්වය හා මනුෂ්‍යත්වය අතර නව බෙදුම් රේඛා නිර්මාණය කරමින් එක්ව සටන් වැදිය යුතුය.

එලෙස ඉතිහාසය අලුතින් ලිවීමට පෙරට එන සියලු ශ්‍රී ලාංකික ජනතාවට, ජනතා බලවේගයන්ට 2023 නව වසර සටන් කරන, ජයග්‍රහණ ලබන, රට දිනවන සුබ නව වසරක්ම වේවායි සුබ පතමු!

# ලොකු පෙරළි කළ හැකි පුංචි ඡන්දය



දැනටමත් වසරක් කල්දමනු ලැබ ඇති පුංචි ඡන්දය හෙවත් පළාත් පාලන මැතිවරණය මෙම නව වසරේ මාර්තු 20ට පෙර පැවැත්විය යුතුව තිබේ. ඡන්දය ප්‍රකාශයට පත් කිරීම ඡන්ද නීතියට අනුව මෙම ජනවාරි 09ට පෙර කළ යුතුය. එහෙත් තවමත් සමාජය තුළ පුංචි ඡන්දය පිළිබඳව ඇත්තේ දෙගිඩියාවකි. ‘ආණ්ඩුව ඡන්දය තියයිද? නොතියයිද?’ යනුවෙන් සැකයක් සමාජය තුළ මතුව තිබේ. ඊට හේතුව රනිල් වික්‍රමසිංහ හා රාජපක්ෂ පාලනය පුංචි ඡන්දයට මහා බියක් පෙන්වීමය.

රනිල්ගේ ආණ්ඩුවට පුංචි ඡන්දය හරියටම ‘මඟ සිටියොත් තෝ නසී. ගෙදර ගියොත් අඹු නසී’ වර්ගයේ එකකි. නීතියට අනුව ඡන්දය නොපවත්වා බැරිය. එහෙත් ඡන්දය පැවැත්වුවහොත් එහි ප්‍රතිඵලය රනිල්ට - රාජපක්ෂලාට ඉතාමත් අවාසිය. ඔවුන් සතු ජන බලයේ ප්‍රමාණය ඉන් මැනෙන අතර ඉන්පසු ඔවුනට රටේ පාලනය පවත්වාගෙන යාමට සදාචාරමය අයිතියක් නැතිවේ. ආණ්ඩුව බිඳවැටීමට මෙම ප්‍රතිඵලයම හේතු විය හැක.

එසේනම් උත්තරය වන්නේ ඡන්දය කල්දැමීමය. එහෙත් දැන් ඊට ඇති නීතිමය අවස්ථා නැති තරම්ය. කුමක් හෝ උප්පරවැට්ටියක් සකසා ඡන්දය කල් දැමුවත් එහිදී මතුවන විරෝධතා රැල්ල දරුණු විය හැක. මන්ද ආණ්ඩුව ගැන කලකිරුණු ජනයා ආණ්ඩුවට පාඩමක් ඉගැන්වීමට බලා සිටින්නේ ඡන්දය එන තුරුය. ගිය වසරේ ආණ්ඩුවට එරෙහිව මහ මඟට බැස අරගල කළ, විරෝධය පළ කළ ජනයා දැන් සිටින්නේ නිහඬවය. ඒ, තම ප්‍රශ්න විසඳීම නිසා හෝ ආණ්ඩුව පිළිබඳව තිබූ විරෝධය අවසන් වීම නිසා නොව තම විරෝධය පෑමට වෙනත් අවස්ථාවක් තිබෙන නිසාය. ජනතාවට ඇති එම අවස්ථාව ඡන්දයය. එය උදුරාගතහොත් එය දිනාග ැනීමට ජනතාව පාරට බහිනු ඇත. එසේම එම විරෝධතා රැල්ල ආණ්ඩුවේ අවසානය සනිටුහන් කරන්නක් වීමටද බැරි නැත.

ඒ අනුව ඡන්දය තිබ්බත් ආණ්ඩුව පරාදය. ඡන්දය නොතිබ්බත් ආණ්ඩුව පරාදය. වඩා ගෞරවනීය පරාජය තෝරා ගැනීම රනිල්-රාජපක්ෂ ආණ්ඩුවේ වගකීමය.

ආණ්ඩුව ඡන්දය නොපවත්වන්නේ නම් ඒ සඳහා නිදහසට කාරණය ලෙස ඉදිරිපත් කිරීමට සූදානම් වන්නේ ආර්ථික අමාරුකම්ය. මේ මොහොතේ මුදල් නැති බවත්, මුදල් නොමැතිව ඡන්දය තැබිය නොහැකි බවත්, අප්‍රේල් වනවිට අයි.එම්.එෆ්. සමග එකඟවී ණයක් ගෙන ආර්ථිකය ගොඩගෙන ඡන්දය පවත්වන බවත් ආදී ලෙසය. එය එසේ වන්නේ නැත. මැතිවරණ දෙපාර්තමේන්තුවට අයවැයෙන් මුදල් වෙන්කර ඇති බවත්, ඡන්දය පැවැත්වීමට මුදල් තිබෙන බවත් මෑතකදී ප්‍රකාශ කළේ මැතිවරණ අධ්‍යක්ෂ ජනරාල්වරයාය. ඒ නිසා ඡන්දය කිරීමට මුදල් නැති කථාව වලංගුවන්නේ නැත.

අනෙක් අතට මේ අර්බුදය වසරකින් දෙකකින් රනිල්-රාජපක්ෂ පාලනය විසින් විසඳනු ඇතැයි සිතීම ලොකුම විහිළුවකි; මුලාවකි. මේ වනවිටත් ජනවාරි සිට විදුලි ගාස්තු වැඩිකරන බවට විදුලිබල ඇමති අනතුරු අඟවා ඇත. 60%කින් පමණ විදුලි ගාස්තු වැඩි වුවහොත් හෝ විදුලිය කප්පාදුව දීර්ඝ වුවහොත් දැනට පණ අදිමින් තිබෙන කර්මාන්ත ශාලා ටිකද අහෝසි වනු ඇත. ව්‍යාපාර, කඩසාප්පු වසා දැමීමට සිදුවනු ඇත. විදුලිය ගාස්තු වැඩිවීම රටේ නිෂ්පාදනය බිඳවැටීමට හේතු වූ විට, දැනටමත් මියගෙ ාස් ඇති ආර්ථිකය නැවතත් වැළලී යනු ඇත. අයි.එම්.එෆ්. වට්ටෝරු කාලය ඊට ප්‍රතිකර්මයක් වන්නේ නැත.

එසේම පසුගිය අයවැය ලේඛනයෙන් යෝජනා කළ ඇතැම් බදු වර්ග ක්‍රියාත්මක වීම මෙම ජනවාරි සිට ආරම්භ වන බව පැවසේ. එවිට බඩු මිලද යළිත් ඉහළ යනු ඇත. රනිල් වික්‍රමසිංහ ඡන්ද පවත්වන්නට සිතන්නේ ආර්ථිකය ගොඩගෙන අවසන්ව නම් ලංකාවේ කිසි දිනක ඡන්ද පවත්වීමට හැකි නොවන බව ස්ථිරය.

රනිල්-රාජපක්ෂලා පුංචි ඡන්දයට මෙතරම් බියවී සිටින්නේ ඇයි? හේතුව ඉතා පැහැදිලිය. පුංචි ඡන්දය ඔවුනට මාරාන්තිකය. ඉන් ඔවුන්ගේ පාලනයේ අවසානය සනිටුහන් වේ. එසේම මාලිමාවේ ජයග්‍රහණය ප්‍රකාශවීමද ඉන් සිදුවේ. රනිල්ගේ බිය දෙගුණ තෙගුණ වන්නේ ඒ නිසාය. එහෙත් දැන් ඉරණමට මුහුණ දෙනවා මිස පාලක පංතියට වෙන විකල්පයක් නැත. බලයේ රැඳීසිටීමට අනීතිකව ප්‍රජාතන්ත්‍ර විරෝධීව, සදාචාර විරෝධීව ගන්නා ඕනෑම පියවරක් හේතු වනුයේ ඔවුන්ගේ ගැලවීමට නොව වැනසීමටය. ඊට හේතුව රටේ සාතිශය බහුතර ජනතාවක් වත්මන් පාලනයත් වත්මන් ක්‍රමයත් ප්‍රතික්ෂේප කරන නිසාය.

මෙය සැබැවින්ම සමාජ පරිවර්තනයක ආරම්භය පෙන්වන යුගයක් බව පැහැදිලිය. පොදු ජනයා පවතින ආණ්ඩුව පමණක් නොව පවතින ක්‍රමයද ප්‍රතික්ෂේප කරමින් නව දේශපාලන ක්‍රියාදාමයකට පෙළගැසීම නිතර සිදු නොවන විශේෂ සංසිද්ධියකි. එය දැන් අපේ රටේ සිදුවෙමින් තිබේ. සමාජ වෙනසක් වෙනුවෙන් පැරණි දේශපාලනය පිළිකෙව් කර පෙරට එන ජනතාවගේ අභිලාෂයන්ගේ ජයග්‍රහණය, ඡන්දයක් කල්දැමීම (එසේ කරන්නේ නම්) වැනි බාල වර්ගයේ ක්‍රියාවන්ගෙන් නතර කළ නොහැක. රනිල්-රාජපක්ෂ ආණ්ඩුවට මෙරට ජනයා විසින් නුදුරේදීම උගන්වනු ලබන පාඩම එය වන්නේය. එතෙක් රනිල්-රාජපක්ෂ ආණ්ඩුව ඇතුළු ඔවුන්ගේ චෞර වලල්ල ‘සැලියේ කෙළිනු’ ඇත .

> රනිල්-රාජපක්ෂලා පුංචි ඡන්දයට මෙතරම් බියවී සිටින්නේ ඇයි? හේතුව ඉතා පැහැදිලිය. පුංචි ඡන්දය ඔවුනට මාරාන්තිකය. ඉන් ඔවුන්ගේ පාලනයේ අවසානය සනිටුහන් වේ. එසේම මාලිමාවේ ජයග්‍රහණය ප්‍රකාශවීමද ඉන් සිදුවේ. රනිල්ගේ බිය දෙගුණ තෙගුණ වන්නේ ඒ නිසාය. එහෙත් දැන් ඉරණමට මුහුණ දෙනවා මිස පාලක පංතියට වෙන විකල්පයක් නැත. බලයේ රැඳීසිටීමට අනීතිකව ප්‍රජාතන්ත්‍ර විරෝධීව, සදාචාර විරෝධීව ගන්නා ඕනෑම පියවරක් හේතු වනුයේ ඔවුන්ගේ ගැලවීමට නොව වැනසීමටය. ඊට හේතුව රටේ සාතිශය බහුතර ජනතාවක් වත්මන් පාලනයත් වත්මන් ක්‍රමයත් ප්‍රතික්ෂේප කරන නිසාය.






# රැකියා විස්සයි දහස් ගණනක් පෝලිමේ

ජපානයේ රැකියා ඇබෑර්තු සඳහා බඳවාගන්නා බවට වූ දැන්වීමක් විදෙස් සේවා නියුක්ති කාර්යාංශය විසින් පසුගිය දිනක ජනමාධ්‍යයන්හි පළ කර තිබිණි. ඒ අනුව දෙසැම්බර් 27වැනි දින විදෙස් සේවා නියුක්ති කාර්යාංශය අසල දිගු පෝලිම් දක්නට ලැබුණේ, අපේ රට පිළිබඳවත් රටේ පවතින ආර්ථික අර්බුදයත්, තරුණ විරැකියාවත් මොනවට පිළිබිඹු කරමිනි.

එම දහස් ගණන් පෝලිම්වල සිටි බහුතරය තරුණියන්ය. නමුත් විදෙස් සේවා නියුක්ති කාර්යාංශය නිවේදනය කළේ කාන්තාවන් සඳහා ඇත්තේ පුරප්පාඩු 20ක් පමණක් බවයි. මෙම දිගු පෝලිම්වල ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය කරන තරුණ තරුණයින් අතර උපාධිධාරීන්ද සිටීම කැපී පෙනෙන අර්බුදයකි.

ඔවුන් මාධ්‍ය වෙත පළ කළ අදහස් අනුව මේ සියලු දෙනාට ඇත්තේ කෙසේ හෝ රට හැර යන අධිෂ්ඨානයයි. රට පිළිබඳ ඔවුන්ගේ හිත් තුළ ගැබ්ව ඇත්තේ අප්‍රලකි. අවිශ්වාසයකි. අදහස් දැක්වූ මව්වරුන්ගේ අදහස ඇත්තේද කෙසේ හෝ දරුවා රට පටවා ඔවුන්ට හොඳ ජීවිතයක් උරුම කරදීමය.

ආර්ථික අර්බුදය, ඒ මගින් ඇතිකරන ලද දේශපාලන අරාජිකත්වය ජනතාව අපේක්ෂාභංගත්වයට පත්කර ඇත. භාණ්ඩ මිල ඉහළ යාම, අධික නිෂ්පාදන වියදම නිසා කර්මාන්ත බිඳවැටීම හමුවේ දහස් ගණනින් රැකියා අහිමි වී තිබීම මෙම පෝලිම්වලින් කියා පාන කරුණකි. ආණ්ඩුවේ සංඛ්‍යාලේඛනවලට අනුව තරුණ විරැකියාව 27%කි. නමුත් යථාර්ථය එයට හාත්පසින්ම වෙනස්ය. අපේ රටේ තරුණ පරම්පරාවෙන් අඩකට වඩා (ලක්ෂ 35 ට වඩා) විරැකියාවෙන් පෙළෙන අතර වර්තමාන රැකියා අහිමිවීම් හමුවේ එය තවත් වර්ධනය වී ඇත. ඒ බව සමාජය දෙසත් මෙවැනි පෝලිම් දෙසත් බලන විට මනාව පසක් වේ.

අනවසර සංක්‍රමණිකයන් ලෙස ලාංකිකයන් රටවල්වලට ඇතුල් වීමට දරන උත්සහයන් දැන් මාධ්‍ය වාර්තාවල සුලබය. සමාජ දුරාචාර ඉහළ යමින් ඇත්තේද මෙම විරැකියාව හා ආර්ථිකය අර්බුදයේම පිළිබිඹුවක් ලෙසය. අයිස්, කුඩු වැනි විෂ මත්ද්‍රව්‍ය ආණ්ඩුව දේශපාලන සැලැස්මක් අනුව කරළියට ගත්තා වුවද, යථාර්ථය තුළද තරුණ පරම්පරාව වේගයෙන් විෂ මත්ද්‍රව්‍ය මගින් ගොදුරු කරගනිමින් සිටී.

රට හැරයාම තෝරාගැනීමට අවස්ථාව හමුවන්නේ ඉතාම අතළොස්සකට නිසා ඉතිරි පිරිස මෙම සමාජයේ ගොදුරු බවට පත්වීම වළක්වා ගත නොහැක. මේ නිසා සමාජයක් ලෙස රට හැරයාම වෙනුවට රට යළි දෙපයින් සිටුවීම තෝරාගත යුතුය. මන්ද මේ විනාශයේ ගොදුරු බවට අපේ අනාගතය පත්වන තුරු බලා සිටීමට අපට අයිතියක් නොමැති නිසාය. ඒ වෙනුවෙන් නැගීසිටීම, සංවිධානය වීම වේගවත්ව කළ යුතුය.

# ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ මහා මණ්ඩල සැසිවාරයට SYU හා SSU එක්වේ

පසුගියදා ලෙබනනයේ පැවැති ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ මහා මණ්ඩල සැසිවාරයට සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එරංග ගුණසේකර හා රංගන දේවප්‍රිය සහෝදරවරුන් සහභාගි වූ අතර එම වැඩසටහනට සමගාමීව ජාත්‍යන්තර සහයෝගීතා අංගයක් ලෙස ඊශ්‍රායිල්-පලස්තීන යුද්ධයෙන් මියගිය ලෙබනන් ජනතාව වෙනුවෙන් ඉදිකළ ස්මාරකයක් නැරඹීමටත්, අනතුරුව ලෙබනනයේ කඳවුරුගතව ජීවත් වෙන පලස්තීන ජනතාව හමුවීමටත් ඔවුන්ට අවස්ථාවක් ලැබුණි.

එහිදී ඉතාම කුඩා භූමියක් තුළ, අඩු පහසුකම් සහිතව ජීවත්වන විශාල ජනතාවක් ඔවුන්ට දැකගැනීමට හැකි වූ අතර උදාවී ඇති ශීත කාලය හමුවේ, බාල මහලු භේදයකින් තොරව එම සරණාගත කඳවුරු තුළ පලස්තීනුවන් ගෙවන අති දුෂ්කර ජීවිතය පිළිබඳවත් ඔවුන්ට අත්දැකීම් ලබන්නට හැකිවිය..



# ජීවිතය දිනන අරගලය රට පුරා

මේක නෙවෙයි ජීවිතේ!- ජීවිතය දිනන අරගලයට set වෙන්න!!- සමාජවාදී තරුණ සංගමය විසින් සංවිධානය කරනු ලබන උද්ඝෝෂණ හා රැලි මාලාවේ තවත් එක් පියවරක් දෙසැම්බර් 24 වැනිදා මාතර දී ඉතා සාර්ථක අයුරින් පැවැත්විණ..

ඒ සඳහා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක එරංග ගුණසේකර, සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික එහි අධ්‍යාපන ලේකම් මහේෂ් අඹේපිටිය, යශෝධා සමරධීර ඇතුළු සහෝදර සහෝදරියන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

එවැනිම තවත් විරෝධතාවක් දෙසැම්බර් 28 වන වනදා කොටිකාවත්ත මංසන්ධියේ දී පැවැත්විණ. එහිදී 'මේක නෙමෙයි ජිවිතේ! දිනන සටනට එක්වන්නට යැයි ජනතාව දැනුවත් කරමින් වීදි නාට්‍යයක්ද රඟදැක්වූ අතර එදින හවස් වරුවේදී වැඩිවන විදුලි බිල, ජීවන වියදම, සහ ආණ්ඩුවේ මර්දනය ඇතුළු කරුණු කිහිපයක් මුල්කොට ගනිමින් රැස්වූ පිරිස පන්දම් දල්වමින් සිය විරෝධතාවය ප්‍රකාශ කර සිටියහ. එම අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග එරංග ගුණසේකර, ජාතික කමිටු සාමාජික අංජන අමරසිංහ, ජනතා විමුක්ති පෙරමුණේ කොටිකාවත්ත ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නිම්මි ගර්ලැක් සහෝදරිය ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.





# සුභ නව වසරක්...?

සුබ/අසුබ සිහිනය
නොදැක/දැක නික්මෙන
තව වසක් ගෙවා
නව වසක් දිහා
බලා හිඳිමුද?
වියැළෙන ප්‍රේමය
වියැකෙන දයාවක
මියැදෙන දේශයක
කුස් නොපිරුණ
දාහයක්..
අගාධෙක,
පතුලක් නැති..
ඉදින් නව වසරක්
අදින් ඇරඹෙනු හැකිද?
නරඹනු ඇතත් ශෝකය
මළගමක් වනු,
නියත දේශය
ඉන් මුදාලන්නට
අවැසිම තැතක් අභිමුව
ඔබ..! මම..! අපි..!
සුභ වසක් කෙරුමට
මේ වස..



## සෞඛ්‍ය ප්‍රතිලාභ රැසක් ගෙන දෙන සුදුලූනු


පුද්ගලයෙකුගේ රුධිර කොලෙස්ටරෝල් කෙරෙහි සුදුලූනුවල බලපෑම පිළිබඳව දැනට බොහෝ පර්යේෂණ සිදුවෙමින් පවතින අතර සුදුලූනු ආහාරයට ගැනීමෙන් කොලෙස්ටරෝල් මට්ටම අඩු කළ හැකි බව අධ්‍යයන කිහිපයක් මගින් පෙන්වා දී ඇත.



අමු සුදුලූනු බල්බවල අඩංගු ඇලියින් නම් ද්‍රව්‍යය වාතයට නිරාවරණය වන විට ඇලිසින් නම් සංයෝගයක් බවට පත්වේ. සුදුලූනුවලට එහි සුවිශේෂී සුවඳ ලබාදෙන්නේ එම සංයෝගයයි. අධ්‍යයනයන්වලට අනුව සුදුලූණු ආහාරයට ගැනීමෙන් LDL කොලෙස්ටරෝල් අඩු කිරීම, ප්‍රතිශක්තිකරණය වැඩි දියුණු කිරීම, රුධිර පීඩනය අඩු කිරීම ඇතුළු සෞඛ්‍ය ප්‍රතිලාභ රාශියක් ලබාගැනීමට හැකිවේ.

## සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක පෙළගැස්වීම "ග්‍රහලෝක පෙළපාළියකින්"

දෙසැම්බර් 28 රාත්‍රී අහසේ සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක පෙළගැසී තිබුණේ "ග්‍රහලෝක පෙළපාලියක්" ලෙස හඳුන්වන පෘථිවියේ සිට පෙනෙන තාරකා විද්‍යාත්මක සංසිද්ධියකිනි.



අඟහරුවාදා රාත්‍රියේද දැකගත හැකි වූ මෙම සංසිද්ධිය මගින් බුධ, සිකුරු, අඟහරු, බ්‍රහස්පති සහ සෙනසුරු වැනි ග්‍රහලෝක පියවි ඇසින් අහස නිරීක්ෂණය කරන්නන්ට පවා පැහැදිලිව දැකගත හැකි වූ අතර දුරදක්නයක උපකාරයෙන් යුරේනස් සහ නෙප්චූන්ද දැකගත හැකි විය.

මෙම ග්‍රහලෝක පෙළගැස්වීම අවම වශයෙන් සෑම වසර දෙකකට වරක් සිදු වේ.

## ලාහෝර්හි කුරුලු නවාතැන



පාකිස්ථානයේ ලාහෝර් (පන්ජාබ්)හි කුරුල්ලන් සඳහාම සාදන ලද මේ කුරුලු කූඩුව මගින් නගරයට ඉහළින් පියාසර කරන බොහෝ පක්ෂීන්ට නවාතැන් සැපයෙනු ඇත. එය විවිධ වර්ගයේ කුරුල්ලන් සිය ගණනක් ජීවත් වන අද්විතීය හා ආකර්ෂණීය කූඩුවකි.

# මේ රට ජයග්‍රහණය කරා ගෙන යා හැකියි

## ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා



***නියමුවා:- ඉතාලිය ඇතුළු යුරෝපයේ රටවල් ගණනාවක කරන ලද සංචාරයේදී ඔබ බොහෝ ශ්‍රී ලාංකිකයින් මුණගැසුණා. මෙම හමුවීම් පිළිබඳ අත්දැකීම් ලාංකේය පාඨකයන් සමග බෙදා ගත්තොත්.***

***අනුර දිසානායක සහෝදරයා:-*** පසුගිය දෙසැම්බර් 09වැනිදා සිට 23 දක්වා කාලය තුළ ඉතාලිය, ජර්මනිය, ස්විට්සර්ලන්තය, ප්‍රංශය යන යුරෝපයේ රටවල්වල නගර ගණනාවකදී ඒවායේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන් මුණ ගැසී සාකච්ඡා කිරීමට අපට හැකි වුණා. එය ඉතාම සාර්ථක සංචාරයක්. මෙහිදි ඉතාලියේ නාපෝලි, ෆෙරෙන්සි, මිලාන්, කෝමෝ සහ වෙරෝනා යන නගරවල ප්‍රධාන රැස්වීම් 5ක්ද ඇතුළුව ජර්මනියේ ඩසල්ඩෝෆ් හා බර්ලින්, ස්විට්සර්ලන්තයේ ජිනීවා සහ ප්‍රංශයේ පැරිස් යන නගරවල ඉතා විශාල ජන සහභාගිත්වයකින් යුතුව අති සාර්ථක රැස්වීම් මාලාවක් පැවැත්වීමට අපට හැකියාව ලැබුණා.

මෙම රැස්වීම් සඳහා ජාතික ජන බලවේගයේ හෝ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් නොවන ශ්‍රී ලාංකිකයින් ඇතුළු වෙනත් දේශපාලන පක්ෂවල තනතුරු දැරූවන් පවා අප හමුවීමට පැමිණ සිටියා. ඔවුන් සියලු දෙනා මව්බිමෙන් දුරස්ව සිටියත් රට තුළ සිදුවෙමින් පවතින දේ පිළිබඳව ඉතාම උනන්දුවෙන් පසුවුණා. රට ගොඩනැගීම වෙනුවෙන් වූ අපේ වැඩපිළිවෙළ සහ සැලසුම් සාර්ථකව ඉටු කරගැනීමට ඔවුන් තමන්ගේ උපරිම සහයෝගය දැක්වීමට එකඟ වුණා.

රැස්වීම්වලට අමතරව මෙම ගමන අතරතුර, ගුවන් තොටුපොළවල්වලදී අහඹු ලෙස හමුවූ ශ්‍රී ලාංකිකයන්ගෙන් පවා ඉතාම ඉහළ ප්‍රතිචාර පළවුණා. විදේශීය ගුවන් සේවාවන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකික කාර්යමණ්ඩලවලින් පවා උණුසුම් පිළිගැනීම් ලැබුණා. මෙසේ මුණ ගැසුණු සියලු ජනතාවගෙන් ලැබුණු ඇදහිය නොහැකි තරම් වූ ආදරය, සහෝදරත්වය, ලෙන්ගතුකම තුළින් පළ වුණේ එක් කරුණක්. ඒ, ඔවුන් මව්බිමේ අනාගතය සම්බන්ධයෙන් අප වෙත කෙතරම් බලාපොරොත්තු තබා තිබෙනවාද කියන එකයි. මෙම ගමන සාර්ථක කරගැනීමට දායක වූ, සහයෝගය දැක්වූ, රට වෙනුවෙන් බලාපොරොත්තු දල්වා ගෙන එක් රැස් වූ සියලු දෙනාට ජාතික ජනබලවේගය වෙනුවෙන් ස්තූතිය පළ කිරීමටත් මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම ඔවුන් අප වෙත තැබූ විශ්වාසය ඒ අයුරින්ම රැකීමට පක්ෂයක් ලෙස අපි කැප වෙන බවට සහතික වනවා.

***නියමුවා:- ආණ්ඩුව පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් බලවත් අකමැත්තකින් සිටින බව පැහැදිලි කරුණක්. මෙය මැතිවරණ පැවැත්වීමට සුදුසු අවස්ථාවක් නොවන බවටත් ඒ වෙනුවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කළ නොහැකි බවටත් ආණ්ඩුවේ විවිධ පාර්ශ්ව මගින් අදහස් පළ වෙමින් තිබෙනවා. ඒ අතරම තමන් ඊට සූදානම් බවටද වහසි බස් කියනවා. මේ තත්වය ඔබ තේරුම් ගන්නේ කොහොමද? ආණ්ඩුවට මේ මැතිවරණය මගහැරිය හැකිද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** ඇත්තටම ආණ්ඩුව ඉන්නේ දෙගිඩියාවකයි. පළාත් පාලන ඡන්දය පසුගිය වසරේ මාර්තු 20ට පෙර පැවැත්විය යුතුව තිබුණා. ඇමතිවරයාගේ බලතල අනුව මේ අවුරුද්දේ මාර්තු 20 දක්වා කල්දැමුවා. දැන් මේ වසරේ මාර්තු 20ට පෙර ඡන්දය පවත්වා පළාත් පාලන ආයතන පිහිටුවන්නත් ඕනෑ. නීතියෙන් ඡන්දය කල්දමන්න තිබුණු අවස්ථා සියල්ල ඉවරයි. නමුත් ජනවරමක් නැති බව මෙයින් ඔප්පු වෙන නිසා ආණ්ඩුවට මේ මැතිවරණය මාරාන්තිකයි. ඒ නිසා රනිල් විවිධ දහම්ගැට ගහමින් ඡන්දය කල්දමන්න හදනවා. ඔහු කලින්ම තරුණ නියෝජනය වැඩිකිරීම, සීමා නිර්ණයන් අලුතින් ඇති කිරීම, ඡන්ද ක්‍රමය වෙනස් කිරීම, පළාත් පාලන මන්ත්‍රීවරුන් අඩුකිරීම හෝ නැත්නම් ජනමත විචාරණයකට යන බව කීවා. දැන් ආණ්ඩුවේ මැති ඇමතිවරුත් ඇතැම් නිලධාරීනුත් ලවා ඡන්දය තියන්න සල්ලි නැති කතාවක් කියනවා.

ලබන වසරේ ආණ්ඩුවේ වියදම විදිහට රුපියල් බිලියන 7900ක් ඇස්තමේන්තු කර තිබෙනවා. ඡන්දයට යන්නේ බිලියන 10යි. ආණ්ඩුව බිලියන 7900ක වියදම් දරන්න ලෑස්තිවී ඉන්න අතර, ඡන්දයට බිලියන 10ක් නැති බව කියන එක විහිළුවක්. ඒ වගේ දේවල් කියන්න ලෑස්ති වෙන්න එපා කියලා ආණ්ඩුවට අවධාරණය කරනවා. මේ මැතිවරණය දිනාගැනීම සඳහා කළ හැකි සියල්ල ජාතික ජන බලවේගය කරනවා. මේ මැතිවරණයෙන් තමන්ගේ තරම දැනගන්න රනිල්ට පුළුවන්. පොහොට්ටුවේ තරම දැනගන්න පොහොට්ටුවටත් පුළුවන්. මේ වන විට රනිලුත් පොහොට්ටුවත් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී අවසන්. රටේ නායකයා හැටියට ඉන්නවත් ආණ්ඩුව කරන්නවත් ඔවුනට බැහැ. ඒ තත්වය යටතේ නීති විරෝධීව මැතිවරණ කල්දාන්න හැදුවොත් එය දිනාගන්න බලකරමින් ජනතාව සමග පාරට බහින්න අපි සූදානම්.

***නියමුවා:- පළාත් පාලන මැතිවරණයෙන් පසු රටේ දේශපාලනයේ බරපතළ වෙනස්කම් ඇති විය හැකි බවට අදහස් පළවනවා. මේ පිළිබඳ ඔබේ පුරෝකථනයන් කවරාකාරද?***

***අනුර දිසානායක සහෝදරයා:-*** පළාත් පාලන මැතිවරණයෙන් ආණ්ඩුවට ජන මතයක් නැති බව ඔප්පු වූ මොහොතේ සිටම රටේ දේශපාලනය විශාල වශයෙන් වෙනස්වීම ආරම්භ වෙනවා. ව්‍යවස්ථාව පෙන්වමින් තවත් අවුරුදු දෙකක් බලයේ සිටීමට ආණ්ඩුවට කිසිසේත්ම ඉඩ දිය යුතු නැහැ. නිසැක ලෙසම ජනතා බල කිරීම හමුවේ ආණ්ඩුවට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න සිදුවනවා.

> **පළාත් පාලන මැතිවරණයෙන් ආණ්ඩුවට ජන මතයක් නැති බව ඔප්පු වූ මොහොතේ සිටම රටේ දේශපාලනය විශාල වශයෙන් වෙනස්වීම ආරම්භ වෙනවා. ව්‍යවස්ථාව පෙන්වමින් තවත් අවුරුදු දෙකක් බලයේ සිටීමට ආණ්ඩුවට කිසිසේත්ම ඉඩ දිය යුතු නැහැ. නිසැක ලෙසම ජනතා බල කිරීම හමුවේ ආණ්ඩුවට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න සිදුවනවා. ඒ එළඹෙන මහ මැතිවරණය ජනතාවගේ පැත්තෙන් අතිශය තීරණාත්මකයි. එහිදී ලංකාවේ ඉතිහාසයේ පළමුවරට ජනතාවාදී පාලනයක් ගොඩනැගෙනවා.**

ඒ එළඹෙන මහ මැතිවරණය ජනතාවගේ පැත්තෙන් අතිශය තීරණාත්මකයි. එහිදී ලංකාවේ ඉතිහාසයේ පළමුවරට ජනතාවාදී පාලනයක් ගොඩනැගෙනවා.

මහ මැතිවරණයෙන් පස්සේ රට තුළ බරපතළ සමාජ ආර්ථික දේශපාලන වෙනස්කම් කරන්න සැලසුම් සකස් කර අවසන්. මේ වන විට රටේ ජනගහනයෙන් විශාල පංගුවක් ආර්ථිකයේ කොටස්කරුවන් නොවෙයි. ඒ තත්වය වෙනස් විය යුතුයි. රටේ ආර්ථිකයේ ප්‍රතිලාභ ගෙදරට ගලාගෙන එන ක්‍රමවේදයක් අපි සකස් කරනවා. ජාතික ධනයෙන් 36%ක් නිෂ්පාදනය කරන්නේ බස්නාහිර පළාතේ. සෙසු පළාත්වලින් ඉතාමත් අඩු දායකත්වයක් ලැබීම තුළින් කියවෙන්නේ ආර්ථිකය අවශ්‍ය ලෙස ප්‍රසාරණය වී නැති බවයි. දායකත්වය වගේම ප්‍රතිලාභත් ගමට තල්ලුවී නැති බවයි. අපි ක්‍රියාත්මක කරන්නේ තියෙන කෙනාගෙන් අත්පත් කර ගැනීම නොවෙයි. නැති කෙනාටත් සාධාරණ පංගුවක් මේ ආර්ථිකයෙන් අත්පත් කර ගැනීමේ ඉඩ ප්‍රස්ථා විවෘත කිරීමයි. මෙයට අදාළ ආර්ථික සැලසුම් ජාතික ජන බලවේගයේ ආර්ථික කමිටුවෙන් සකස් කර අවසන්.

රට හැදීමේ ප්‍රමුඛ තම සාධකය වංචාවෙන්, දූෂණයෙන් නාස්තියෙන් තොර පාලනයක් පිහිටුවීමයි. ඒ පාලනය ගොඩනගන්නේ ජාතික ජන බලවේගයේ දේශපාලන සංස්කෘතියේ ඇත්ත වෙනසක් මේ රටේ ජනතාවට ලබාදීමෙනුයි. එක්සත් ජාතික පක්ෂයේ දාහත් වසරක පාලනය තුළ සිටි හොරු ගෙනල්ලා ගෝල්ෆේස් පිට්ටනියේදී හම ගහන බව කියපු හැටි අපට මතකයි. ඒත් එයා යනකොට ගියේ චෞර රැජින බවට නම් ලබලා. මහින්ද රාජපක්ෂත් වංචා, දූෂණයේ යෙදුණා වගේම ඒ වෙනුවෙන් ගැඹුරුතම ඉඩක් හැදුවා. යහපාලනය ගොඩනගන බව කියලා බලයට ආපු රනිල් දවස් 50කින් මහ බැංකුවට ගැහුවා. රනිල් වික්‍රමසිංහ ඇතුළු හොරුන්ට දඬුවම් දෙන බව කියලා බලයට ආපු ගෝඨාභයත් මේ දූෂිත දේශපාලන සංස්කෘතිය ඉදිරියට ගෙනගියා. ඒ විතරක් නෙමෙයි. දැන් පොහොට්ටුවේ මන්ත්‍රීවරු තමන් හොරා කියපු රනිල් වික්‍රමසිංහ ජනාධිපති හැටියට පත්කරගෙනත් ඉන්නවා. අපි මේ කැත, මජර දේශපාලන සංස්කෘතිය වෙනස් කරනවා විතරක් නොවෙයි ජාතික ජන බලවේගයේ පාලනයක් යටතේ වංචා දූෂණවලට වගකිවයුතු සියලු දෙනා අධිකරණය ඉදිරියට පමුණුවනවා. හොරකම් කළ දේපොළ අත්පත් කර ගන්නවා. මේ බරපතළ දේශපාලන වෙනස්කම් කරන්න පුළුවන් ජාතික ජන බලවේගය වගේ අදූෂිත ව්‍යාපාරයකට විතරයි.

***නියමුවා:- ඔබ ප්‍රකාශ කළ අභියෝග ජය ගැනීම සඳහා වන ජාතික ජන බලවේගයේ සූදානම සහ නව වසරේ ජනතාවට ඔබේ පණිවිඩය ගැන කිවුවොත්.***

***අනුර දිසානායක සහෝදරයා:-*** මේ රට ගොඩනැගීම සඳහා අවංක කැපකිරීම් කළ හැකි කණ්ඩායම ඉන්නේ ජාතික ජන බලවේගය තුළ පමණක් බව ජනතාව වේගයෙන් තේරුම් ගනිමින් ඉන්නවා. දිනපතාම තේරුම් ගන්නා පිරිස වැඩිවෙමින් ඉන්නවා. ඒ බව රට පුරා යන අපට පේනවා. මේ රට ගොඩනැගීම වෙනුවෙන් වැඩ කරන, කැපකිරීම් කරන රටේ ඉහළම විද්වතුන් සියලු දෙනාම පාහේ ජාතික ජන බලවේගය වටා එකතු වී ඉන්නවා. ඔවුන් රටේ ජනතාවට අනාගතයේ සිදුවන ව්‍යසනය දකින මේ පිරිසයි. ඒ නිසාම රට වෙනස් කිරීමේ ස්ථිර අධිෂ්ඨානයෙන් ජාතික ජන බලවේගය වටා ඒකරාශී වී සිටිනවා. අතිශය අමාරු කාලවලදී පවා පොදු අරමුණු වෙනුවෙන් මැදිහත් වුණු විශාල පිරිසක් මේ රට හැදීම වෙනුවෙන් ජාතික ජන බලවේගයට පාලන බලය ලබාදීමට කැපවී ක්‍රියාකරමින් ඉන්නවා. විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන්, කලාකරුවන්, ස්වේච්ඡා සංවිධාන, තරුණ, ශිෂ්‍ය, කාන්තා, ගොවි, ධීවර ඇතුළු සියලුම ජන කොටස් මේ අරමුණු වෙනුවෙන් ඒකරාශී වෙමින් සිටිනවා. මේ රටේ සියලුම ආගම්වල ප්‍රගතිශීලී පූජකතුමන්ලා ජාතික ජන බලවේගයට එක්වී සිටිනවා. ඒ විතරක් නොවෙයි ඉතාලිය, ප්‍රංශය, ජර්මනිය ඇතුළු යුරෝපා රටවල් වගේම මැදපෙරදිග සහ ආසියාවේ අනෙකුත් රටවල රැකියා කරන ශ්‍රී ලාංකිකයන් දහස් ගණනක් ජාතික ජන බලවේගයේ ක්‍රියාකාරීන් බවට මේ වෙනකොටත් පත්වී සිටිනවා. මේ හැම දෙනාම ජාතික ජන බලවේගයට පාලනය බාර දෙන්න විශේෂ ඇපකැපවීමකින් වැඩ කරනවා.

ඒ වගේම අප තව විශාල වැඩකොටසක් කළ යුතුව තිබෙනවා. ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් විශාල ජයග්‍රහණයක් ලබාගනිමින් ඉන්පසුව දිනා ගන්නා මහා මැතිවරණයේදී අපි ඔක්කෝම එකතු වෙලා ජාතික ජන බලවේගයේ පාලනයක් පිහිටුවා මේ රට ජයග්‍රහණය කරා ගෙන යා හැකියි. එය අපිට කළ හැකි දෙයක්; කළ යුතු දෙයක්. දියුණු රටක් පිළිබඳව, අපේ දුවා දරුවන්ට යහපත් අනාගතයක් පිළිබඳව සිහින දකින සියලු දෙනාට නව වසරේ මේ නව දේශපාලන ගමන සමග පෙළගැසෙන ලෙස ඉල්ලා සිටිනවා.

# ජනතා බලය යටපත් කළ පේරු දේශපාලන කුමන්ත්‍රණය



එක්සත් ජනපදයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක වූ කුමන්ත්‍රණයකට අනුව පසුගිය දෙසැම්බර් 7 වනදා පීරුහි ජනාධිපති පෙඩ්‍රෝ කැස්ටිලෝ ජනාධිපති ධූරයෙන් පහ කර අත්අඩංගුවට ගන්නා ලදී. ඔහු ධූරයෙන් පහ කර අත්අඩංගුවට ගැනීමට පෙර දක්ෂිණාංශික බලයක් සහිත එරට පාර්ලිමේන්තුව විසින් ඔහුට එරෙහිව දෝෂාභියෝගයක් සම්මත කර ගන්නට සමත් විය. ඒ සඳහා පක්ෂව ඡන්ද 107ක් ලැබී තිබූ අතර විපක්ෂව ඡන්ද 06 ක් ලැබී තිබුණි. එකොළොස් දෙනෙකු ඡන්දය දීමෙන් වැළකී සිට තිබුණි. ප්‍රගතිශීලී, අධිරාජ්‍යවිරෝධී හා වාමාංශික නායකයකු බව පෙන්වූ කැස්ටිලෝ 2021 වසරේ ජූනි මස පැවැත්වූ ජනාධිපතිවරණයෙන් ජය ගෙන එම වසරේ ජූලි මාසයේ දී ජනාධිපතිවරයා වශයෙන් දිවුරුම් දීමෙන් පසු ගත වූ මාස 18ක කාලයේදී ඔහුට එරෙහිව දක්ෂිණාංශික පාර්ලිමේන්තුව විසින් ගෙනෙන ලද තුන්වන දෝෂාභියෝගය මෙයයි.

දෝෂාභියෝගය සම්මත වීමට පැය කීපයකට ප්‍රථම ජනාධිපතිවරයා ඔහුට ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලතල අනුව පාර්ලිමේන්තුව තාවකාලිකව විසුරුවා මාස නමයක් ඇතුළත පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමටත් ඒ දක්වා 'හදිසි ආණ්ඩුවක්' ස්ථාපිත කිරීමටත් රට පුරා ඇඳිරිනීතිය පැනවීමටත් නියෝග කළද එය ක්‍රියාත්මක නොවුණි. ඔහු ගත් එකී තීරණයට එරෙහිව ඔහුගේ අමාත්‍ය මණ්ඩලයේ ඉල්ලා අස් වූ අතර ඔහු නියෝජනය කරන නිදහස් පීරු පක්ෂයද ඔහුගේ එම ක්‍රියාව අනුමත නොකළාය. එදින සවස් වරුවේදී උප ජනාධිපතිවරියව සිටි දීනා බොලු ආර්තේ එරට ප්‍රථම කාන්තා ජනාධිපතිවරිය වෙමින් ජනාධිපති ධූරයෙහි දිවුරුම් දුන්නාය.

**පෙඩ්‍රෝ කැස්ටිලෝගේ ආගමනය හා කුමන්ත්‍රණයේ ගමන් මඟ**

2021 වසරේ ජූනි 6 වන දින පීරු ජනාධිපතිවරණයේ දෙවන වටයෙන් 50.13% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් පෙඩ්‍රෝ කැස්ටිලෝ ජනාධිපතිවරයා ලෙස තේරී පත්විය. ඔහු විසින් පරාජයට පත් කරන ලද්දේ පීරුහි ඒකාධිපති පාලක ඇල්බර්ටෝ ෆුජිමෝරිගේ දුව වන කෙයිකෝ ෆුජිමෝරිවය. පෙරුවියානු දක්ෂිණාංශික බලවේගයන්ගේ නායිකාව වූ ඇය ජනාධිපතිවරණ ප්‍රතිඵල ප්‍රතික්ෂේප කරමින් කැස්ටිලෝට එරෙහිව ක්‍රියාමාර්ගවලට එළඹියාය. කැස්ටිලෝ සිය මැතිවරණ වැඩපිළිවෙළ මගින් එරටට නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමටත් ජනතාවට පුළුල් සමාජ සුබසාධනයන් ඇති කිරීමටත් පොරොන්දු වී තිබුණි. එහෙත් පසුගිය මාස 18ක කාලය තුළදී ඒ සඳහා මඟ අහුරමින් ඔහුගේ පාලනය අස්ථාවර කිරීමට දක්ෂිණාංශික බලවේග කටයුතු කළේය. 'කොමියුනිස්ට්වාදය පෙරළා දැමීමේ' සටන් පාඨය යටතේ එරට නීතිපති ඇතුළු හැකි සෑම දෙයක්ම යොදාගනිමින් කැස්ටිලෝ ආණ්ඩුවේ පැවැත්ම අභියෝගයට ලක් කරමින් කටයුතු කෙරිණි.

පෙඩ්‍රෝ කැස්ටිලෝ ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළද එරට පාර්ලිමේන්තුවේ බලය ඇත්තේ දක්ෂිණාංශික දේශපාලන පක්ෂ අතය. කැස්ටිලෝගේ පාලනයට එරෙහිව දක්ෂිණාංශික පාර්ලිමේන්තුවෙන් දිගින් දිගටම බාධා එල්ල විය. පසුගිය මාස 18ක කාලය තුළදී ඔහුට සිය ඇමති මණ්ඩලය අවස්ථා හතරකදී වෙනස් කිරීමට සිදුවිය. දේශපාලන සාමය පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේන්තුව සමග ගැටුම් ඇති කර ගත් ඇමතිවරුන් ගණනාවක් ඉවත් කිරීමට ඔහුට සිදු විය.

එපමණක් නොව එරට නීතිපතිවරයාද ඔහුට එරෙහිව දූෂණ, අපරාධ සංවිධානය, බලපෑම් කිරීම්, යුක්තිය පසිඳලීම වළක්වාලමින් පුද්ගලික රහස් රැකීම, කුමන්ත්‍රණයන්ට හවුල් වීම ආදී චෝදනා යටතේ පරීක්ෂණ හයක් ආරම්භ කර තිබේ. මේ අතර දක්ෂිණාංශික කණ්ඩායම් ප්‍රධාන ධාරාවේ මාධ්‍ය යොදා ගනිමින් දිගින් දිගටම ඔහුටත් ඔහුගේ අමාත්‍ය මණ්ඩලයටත් මඩ, අවලාද එල්ල කරන ලදී. මාධ්‍ය මගින් එල්ල කරන චෝදනා පදනම් කරගනිමින් ජනාධිපතිවරයාට එරෙහිව පාර්ලිමේන්තුව තුළ නිරන්තරයෙන් දෝෂාභියෝග ගෙන එන ලදී. මේ අතර එරට ඊනියා අධිකරණයද එකී පදනම් විරහිත චෝදනා සඳහා සහාය දක්වමින් කටයුතු කරන අයුරු පෙනෙන්නට තිබේ.

මෙම කුමන්ත්‍රණ සඳහා හිටපු ඒකාධිපති ඇල්බර්ටෝ ෆුජිමෝරිට සහාය පළ කරමින් එරට ඉදිරි පෙළේ ව්‍යාපාරික කණ්ඩායම්ද කර්මාන්තයන්ගේ ජාතික සංගමයද හිටපු හමුදා නිලධාරීන්ද කටයුතු කරන බවට සාක්ෂි තිබේ. මේ අතර පසුගිය දෙසැම්බර් දොළොස් වැනි දින පෙරුවියානු පාර්ලිමේන්තුව ජනාධිපතිවරයා ලෙස කැස්ටිලෝට තිබූ මුක්තිය ඉවත් කිරීමේ යෝජනාවක්ද සම්මත කර ගන්නා ලදී. ඒ අනුව ඉදිරි මාස 36ක කාලයක් එනම් අවුරුදු තුනක කාලයක් ඔහුව රඳවා තබා ගැනීමට එරට නීතිපතිවරයාට හැකියාව ලැබී තිබේ.

**කුමන්ත්‍රණයට එරෙහිව ජනතාව පාරට**

පෙරුවියානු ජනාධිපති කැස්ටිලෝට එරෙහිව ක්‍රියාත්මක වූ මෙම කුමන්ත්‍රණයට සහාය පළ කරමින් හා නව ජනාධිපතිවරියට සුභ පතමින් එක්සත් ජනපද ගැති ඇමරිකානු රාජ්‍යයන්ගේ සංවිධානය නිවේදනයක් නිකුත් කළේය. මේ අතර ලතින් ඇමරිකාව පුරා පවතින ප්‍රගතිශීලී ආණ්ඩුවල නායකයෝ මෙම කුමන්ත්‍රණය හෙළා දකිමින් හා ජනවරමක් සහිත ජනාධිපතිවරයාව නැවත ධූරයේ පිහිටවන ලෙස බලකරමින් නිවේදන නිකුත් කර තිබේ.

රට පුරා දස දහස් ගණනින් ජනතාවද මෙම කුමන්ත්‍රණයට එරෙහිව විරෝධතාවලට පිවිස තිබේ. දරුණු පොලිස් මර්දනයක් හමුවේ වුවද අගනුවර වන ලීමාහි විරෝධතා පැවැත්වෙමින් තිබෙන අතර පාර්ලිමේන්තුව ඉදිරිපිට අඛණ්ඩ විරෝධතා සංවිධානය කරනු ලැබ තිබේ. මීට අමතරව රට පුරා නගරවලද බලයෙන් පහකළ ජනාධිපතිවරයාට සහාය පළ කරමින් දැවැන්ත විරෝධතා සංවිධානය වෙමින් තිබේ. මේ තත්වය තුළ දක්ෂිණාංශික පාර්ලිමේන්තුවට ඉක්මන් මැතිවරණයකට යෑමට සිදු වන බවට දේශපාලන විචාරකයෝ මත පළ කරති.

# ගතවූ වසරේ හා එළඹි වසරේ ජාත්‍යන්තර දේශපාලනය

පසුගිය වසරේදී ජාත්‍යන්තර දේශපාලනයේ වඩාත් අවධානයට ලක් වූ ගැටුම වූයේ යුක්රේනය තුළ රුසියාව විසින් සිදුකළ විශේෂ යුද මෙහෙයුමයි. එහි අරමුණ ලෙස දැක්වූයේ යුක්රේනයේ නාසිවාදය තුරන් කිරීමයි. කෙසේ වෙතත් බොහෝ විචාරකයන් පවසන්නේ එම ගැටුම බහුපාක්ෂික ජාත්‍යන්තර ක්‍රමයක් පැන නැගීමට අවශ්‍ය දොරටු විවෘත කළ බවයි.

රුසියාවට එරෙහිව සම්බාධක ක්‍රියාත්මක කිරීමෙන් පසු යුරෝපය තමන් සිතූ තරම් ඔවුන් ස්වාධීන නැති බව ඔවුන් සිතනවාට වඩා රුසියානු භාණ්ඩ මත යැපෙන බවත් තේරුම් ගත්තේය. මේ හේතුවෙන් රුසියාවට එරෙහිව සම්බාධක තවදුරටත් ක්‍රියාත්මක කරනවාද නැද්ද යන්න තීරණය කිරීමට ඔවුන්ට බල කෙරී තිබේ. එමගින් සිදුව ඇත්තේ පුටින්ගේ පාලනය දුර්වල වීම වෙනුවට ශක්තිමත් වීමයි. ආර්ථික සබඳතා වඩාත් ශක්තිමත් වීමයි. කලින් යුරෝපය පුරා ගිය රුසියානු නිෂ්පාදන හා අමුද්‍රව්‍ය දැන් ලතින් ඇමෙරිකානු, අප්‍රිකානු හා ආසියානු රටවල් කරා ළඟා වෙමින් තිබේ.

ඩොලරය හා යුරෝ මුදල් ඒකක සිතූ තරම්




ශක්තිමත් නැති බවත් නැගී එන ආර්ථිකයන් යුවාන් සහ රූබල් සමග ගනුදෙනු කරමින් සිටින බවත් පෙනෙන්නට තිබේ. එසේම යුරෝපය මත එක්සත් ජනපදයේ බලපෑම හීන වෙමින් යයි. මේ සියල්ලේ ප්‍රතිඵලය වී ඇත්තේ මෙම ශීත ඍතුව යුරෝපය අධික ශීතලෙන් මිරිකා දැමීමයි.

පසුගිය වසර තුළ එකිනෙකා මත ආධිපත්‍යය නොව අන්‍යෝන්‍ය ගෞරවය මත කටයුතු කරන නොබැඳි ජාතීන්ගේ සමුළුව, යුරේසියානු ආර්ථික සංගමය (EEU), CELAC, ALBA-TCP, G77¬China, BRICS වැනි සහයෝගීතා ව්‍යාපාරද ජාත්‍යන්තර වශයෙන් ප්‍රබල භූමිකාවක් රඟපෑවේය.

පසුගිය වසර තුළ ඉරානය, රුසියාව හා චීනය අතර සබඳතා ශක්තිමත් විය. මෙම රටවල් ත්‍රිත්වය වර්ග කිලෝමීටර මිලියන 29ක භූමියක් පුරා පැතිරෙන අතර ලෝක දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට විසි දෙකකට හිමිකම් කියයි.

එසේම පසුගිය වසර තුළ දී ලෝකයේ ගැටුම් පවතින තැන්වල උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO) තහවුරු වීමද සිදුවිය. එහෙත් එය ඉදිරියේදී එක්සත් ජනපදය අභියෝගයට ලක් කරන අන්දමේ සන්ධානයන් ඇති වීමට මඟ පෑදීමටද ඉඩකඩ තිබේ.

පසුගිය වසර තුළදී ඉන්දියාව ලෝක ආර්ථිකයේ පස් වන ස්ථානයට පත් වූයේ බ්‍රිතාන්‍යය පසුපසට තල්ලු කර දමමිනි. මේ නිසා ලෝක ආර්ථිකය තුළ ඉන්දියාවේ බලපෑමද වර්ධනය වී තිබේ.

ඉදිරි වසරේ බොරතෙල් නිෂ්පාදනයේදී නැගී එන ආර්ථිකයන්ද වැදගත් ස්ථානයක් ගනු ඇති බව ඔපෙක් සංවිධානය පවසයි. 2023 වසරේ ඔවුන් දිනකට බැරල් මිලියන 29.2ක් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන බවත් වැඩිවන ඉල්ලුම සපයනු ඇත්තේ නැගී එන නව ආර්ථිකයන් විසින් බවත් පැවසේ.

## රුසියාව: සම්බාධක මැද නව වෙළඳපොළ සොයා



රුසියාව, යුරෝපය හා එක්සත් ජනපදය වෙත කෙරෙන ඔවුන්ගේ ලෝහ නිෂ්පාදන අපනයනය නවතා දැමීමට තීරණය කර තිබේ. ඒ වෙනුවට රුසියාව සිය නිෂ්පාදන චීනය, තුර්කිය, ගිනිකොන දිග ආසියානු රටවලට සහ ලතින් අමරිකානු, අප්‍රිකානු රටවලට අපනයනය කිරීමට තීරණය කර තිබේ. එක්සත් ජනපදය හා යුරෝපය විසින් රුසියාවට පනවා ඇති සම්බාධක ඊට හේතුවයි. රුසියාව ලෝකයේ විශාලතම ලෝහ නිෂ්පාදනය කරන රටවල් අතුරින් එකකි. ලෝක ටයිටේනියම්ල නිෂ්පාදනයෙන් 13%ක්, නිකල් නිෂ්පාදනයෙන් 11.2%ක්, ප්ලැටිනම් නිෂ්පාදනයෙන් 10.5%ක්, ඇලුමිනියම් නිෂ්පාදනයෙන් 5.4%ක් තඹ නිෂ්පාදනයෙන් 4% ක් සිදුකරන්නේ රුසියාවයි.

## ලෝකය: අවි වෙළඳාම ජයටම




2020 වසරට සාපේක්ෂව 2021 වසරේදී ලෝකයේ ආයුධ අලෙවිය 1.9% කින් ඉහළ ගොස් ඇතැයි ස්ටොක්හෝම් ජාත්‍යන්තර සාම පර්යේෂණායතනය සිය නවතම වාර්තා මගින් හෙළිදරව් කර තිබේ. ලෝකයේ ආයුධ වෙළඳාමේ ප්‍රමුඛයා වී සිටින්නේ එක්සත් ජනපදයයි. ලෝක ආයුධ වෙළඳාමෙන් 50%ක් සිදු කරන්නේ එක්සත් ජනපදය වන අතර ලෝක ආයුධ වෙළඳාමෙන් සියයට 18%ක් චීනයද 6.8%ක් බ්‍රිතාන්‍යය විසින්ද සිදුකරනු ලබයි.

## බ්‍රිතාන්‍යය: දුම්රිය කම්කරුවෝ වැඩවරමින්




පසුගිය දෙසැම්බර් 13, 14 සහ 16, 17 දිනයන්හිදී බ්‍රිතාන්‍ය දුම්රිය සේවකයෝ සාධාරණ වැටුප් වැඩිවීමක් ඉල්ලා වැඩ වර්ජනයක නිරත වූහ. ඊට නායකත්වය දුන්නේ දුම්රිය නෞකා හා ගමනාගමන කම්කරුවන්ගේ ජාතික සංගමය මගිනි. එම වැඩවර්ජනයට දුම්රිය මෙහෙයුම් සමාගම් දාහතරක් නියෝජනය කරමින් 40,000 පමණ පිරිසක් එක්ව සිටියහ.

## ලෝකය: නව ආර්ථික ධ්‍රැව ගොඩනැගෙමින්



එළැඹෙන ජනවාරියේදී ඉරානය, යුරේසියානු ආර්ථික සංගමය සමග නිදහස් වෙළඳ ගිවිසුමකට එළැඹීමට තීරණය කර තිබේ. යුරේසියානු ආර්ථික සංගමය 2015 වසරේ දී රුසියාව, බෙලරුසියාව හා කසකස්තානය එක්ව ගොඩනැගූ සංගමයකි. දැන් එයට ආර්මේනියාව හා කිර්ගීසියාවද එක් වී සිටී. වියට්නාමයද කලාපීය නොවන රටක් ලෙස ඊට සම්බන්ධ වී සිටි. මෙම ගිවිසුමත් සමග ඉරානයට වඩා පහසුවෙන් මෙම රටවල් සමඟ වෙළඳ ගනුදෙනු කිරීමට හැකියාව ලැබෙනු ඇත

# පුද්ගලීකරණය: නිදහස්කරණයේ මිථ්‍යාව සහ සංවර්ධනය


පසුගිය අයවැය ඉදිරිපත් කිරීමෙන් පසු දේශපාලන ලෝකය තුළ යළිත් රාජ්‍ය ව්‍යාපාර විකිණීම පිළිබඳව සාකච්ඡාව මතුවී ඇත. දැන් යෝජනා වී ඇත්තේ ලාභ ලබන රාජ්‍ය ව්‍යාපාර හා ජනතාවට අයිති ආණ්ඩුවේ පාලනය යටතේ ඇති ජාතික සම්පත් විකිණීමය. ඒ සඳහා අදහස් කර ඇති රාජ්‍ය ව්‍යාපාර හා ආයතන 35ක පමණ ලැයිස්තුවක්ද සමාජ මාධ්‍ය තුළ ප්‍රචාරය වෙමින් තිබේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා ටෙලිකොම්, වෝටර්ස් ඒජ් හෝටලය, හිල්ටන් හෝටලය, ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය, ස.තො.ස., ඖෂධ නීතිගත සංස්ථාව, ප්‍රමිති ආයතනය, ශ්‍රී ලංකා රේගුව, වී අලෙවි මණ්ඩලය, විදුලි බල මණ්ඩලය හා පොල් සංස්ථාව ඇතුළු ආයතන ඒ අතර වේ.

මීට කලින් පැවැති රනිල් වික්‍රමසිංහද තනතුරු දැරූ ආණ්ඩු මෙන්ම රාජපක්ෂවරුන් ඇමති ධුර දැරූ පාලන කාලයේදීද රාජ්‍ය ආයතන විකිණීමේදී එම විකිණීම් සාධාරණීයකරණයට යොදාගත් තර්කය වූයේ එම ආයතන පාඩු ලබන නිසා විකිණීම ලාභදායක බවයි. රජයට බරක් වන ආයතන විකිණීම මෑත ඉතිහාසයේ ධනපති පාලකයින්ගේ අභිලාෂය විය. දැන් තර්කය වී ඇත්තේ ලාභ ලබන ආයතන විකිණීමට සිදුව ඇත්තේ පාඩු ලබන ආයතන ගැනීමට කිසිවක් ඉදිරිපත් නොවන නිසා බවයි. දැන් විකිණීමේ අවශ්‍යතාවය වී ඇත්තේ එම ආයතන තවත් දියුණු කර ආර්ථිකය ශක්තිමත් කිරීම නොව මේ වන විට ආණ්ඩුව මුහුණ දී තිබෙන විදේශ විනිමය හිඟයට තාවකාලිකව හෝ උත්තරයක් සොයා ගැනීමය.

## විකිණීමට හිත හදන මත

රාජ්‍ය ව්‍යාපාර සහ පුද්ගලීකරණයට අදාළ ජන මනස සකස් කිරීම සඳහා පැවැති මෙන්ම වර්තමාන ආණ්ඩුවද ඉදිරිපත් කරන සුලබ තර්ක කිහිපයක් ඇත. 2001 -2004 දක්වා පැවැති රනිල් - චන්ද්‍රිකා හවුල් පාලනයද (ජනාධිපති චන්ද්‍රිකා කුමාරසිංහ, අගමැති රනිල් වික්‍රමසිංහ) විකිණීම සඳහා යොදාගත් යෙදුම වූයේ 'පුද්ගලීකරණයෙන් පුනර්ජීවනය' යන්නයි. පුද්ගලීකරණයෙන් ජනතාවගේ අතමිට සරුවන බවත්, ජීවන බර හැල්ලු වන බවත්, ආර්ථික කාන්තාරයට පුද්ගලීකරණය මහා වර්ෂාවක් වනු ඇති බවත් මීට අවුරුදු 20කට ඉහතකදී මේ පාලකයෝම උජාරුවෙන් දේශනා කළහ. ඒ තත්වය තුළ සමාජයේද විකිණීම (පුද්ගලීකරණය) පිළිබඳව දුර්මත රාශියක් පැලපදියම් කරනු ලැබ ඇත. රාජ්‍ය ආයතන අකාර්යක්ෂම හා අසාර්ථක බැවින් ආර්ථිකයන් වර්ධනය කිරීමටත් කාර්යක්ෂම වීමටත් පුද්ගලීකරණයට හැකියාවක් ඇති බව එවැනි එක් දුර්මතයකි. එය නිවැරදි වූයේ නම්, අද පුද්ගලීකරණයෙන් ලංකාවේ මෙන් සිය දහස් ගුණයක් ඉදිරියට ගොස් ඇති ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු ප්‍රධාන ධනපති කඳවුරේ රටවල ජනතාවන්ට ආර්ථික අර්බුදයක් නොමැති විය යුතුය.

රාජ්‍ය සංස්ථා පමණක් නොව අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි ක්ෂේත්‍රද මහජන




උපයෝගීතා සේවාවන්ද බැංකු රක්ෂණ වැනි මූල්‍ය ක්ෂේත්‍රයද පුද්ගලීකරණයට ලක්කළ නැගෙනහිර ආසියාවේ රටවල් (මැලේසියා, ඉන්දුනීසියාව, තායිලන්තය, දකුණු කොරියාව) 1998-2001 යුගයේදීමද ඇමෙරිකාව ඇතුළු ලතින් ඇමෙරිකානු හා යුරෝපයේ බොහෝ රටවල් 2008 න් පසුවද දැඩි ආර්ථික පීඩනයන්ට අර්බුදයන්ට ලක්වූ බව නොරහසකි. චීනය, ජපානය, වියට්නාමය වැනි රටවල් කිහිපයක් හැර ලෝක සිතියමේ පුද්ගලීකරණය හොඳම විසඳුමක් ලෙස පිළිගත් රටවල් රැසකම අදටත් පවතින්නේ ඍණ ආර්ථික වර්ධනයකි. එසේම ඒවායේ යළි ගොඩ ඒමක් පේනතෙක් මානයක නැති අර්බුද වැළකි. ඔවුන්ගේ ආර්ථිකයන් මේ මට්ටමෙන් හෝ පවතින්නේ රාජ්‍ය මැදිහත්වීම නැති සාධාරණ පුද්ගලික ව්‍යාපාර නිසා නොව, රාජ්‍ය අනුග්‍රහයන්ද සහිතව සිදුකරන අධිරාජ්‍යවාදී මැදිහත්වීම්වලින් දුප්පත් රටවල් කොල්ලකෑම්, මත්ද්‍රව්‍ය, අවි ආයුධ හා ඖෂධ වැනි ජාවාරම් නිසාවෙනි. කළු ආර්ථිකයක් නොමැතිව ඔවුන්ගේ රටවල පුනර්ජීවනය තබා ජීවිතවල එදිනෙදා පැවැත්මක්වත් නැත.

## නවලෝක රටාව (New World Order)

වර්තමානයේ අර්බුදයෙන් අර්බුදයට පත් ලෝකයේ බොහෝ රටවල් පවත්වාගෙන ආ ආර්ථික මොඩලය 'නිදහස් වෙළඳපොළ' නැතිනම් 'නව ලිබරල් ආර්ථික මොඩලය'යි. රජය ආර්ථික කටයුතුවලින් ඉවත්වීම මෙහි මූලික හරයයි. මෙම නිදහස් වෙළඳපොළ මහිමය උත්කර්ෂයට නංවන ලද රටවල්ම 2008න් පසු මේ දක්වාම කඩා වැටෙමින් පවතී.

2008-2010 ඇමෙරිකානු එක්සත් ජනපදයේ ආර්ථික අර්බුදයත් සමග නියාමනයෙන් මිදීමේ ප්‍රතිඵල ලෙස කඩා වැටුණු මූල්‍ය බැංකු පද්ධතිය ඇතිවී තිබෙන තත්වය පිළිබඳ අධ්‍යයනය කිරිමට එක්සත් ජනපදය විසින් සෙනෙට් සභාවේ ආණ්ඩු සංනිරීක්ෂණ හා ප්‍රතිසංස්කරණ කමිටුව' (House Committee on Goverment Oversight and Reforms) නමින් කමිටුවක් පත් කරන ලදී. 2008 ඔක්තෝබර් 04 මෙම කමිටුව හමුවේ සාක්ෂි ඉදිරිපත් කළ, අවුරුදු 19ක් ඇමෙරිකානු ෆෙඩරල් රිසර්ව් මධ්‍යම බැංකුවේ සභාපති වූ ඇලන් ග්‍රින්ස්පැන් (ඔහු ජනාධිපති රොනල්ඩ් රේගන්ගේ නව ලිබරල්වාදී නිදහස් වෙළඳපොළ චින්තනයේ මුල් පෙළේ නියෝජිතයෙකි) තමන්ගේ ප්‍රකාශනයේදී පවසා සිටියේ, මූල්‍ය වෙළඳපොළ මේසා වියරු ලෙස හැසිරීම පිළිබඳව තමාට පැවැතියේ වැරදි වැටහීමක් බවයි. එහිදී එම කමිටුවේ සභාපති ඩිමොක්‍රටිස් සභික හෙන්රි වැක්සිමස්, ග්‍රින්ස්පැන්ගේ එම ප්‍රකාශය අවසානයේදී 'වෙනත් විදිහකින් කියතොත් එයින් කියන්නේ, ඔබගේ ලෝක දර්ශනය, ඔබේ දෘෂ්ටිවාදය, නිවැරදි නොවන බව, එය තවදුරටත් වැඩ නොකරන බව නොවේදැ'යි විමසා සිටියේය. ඇලන් ග්‍රින්ස්පැන්ගේ පිළිතුර වූයේ 'හරියටම හරි' (Precisely) යන්නයි.

නව ලිබරල්වාදය තවදුරටත් නිර්බාධක වෙළඳපොළ සංකල්පය ලෙස ලොව පුරා හොල්මන් කරන ආකාරය ක්විස්ලන්ත සමාජ ආර්ථික විද්‍යාඥ ජෝන් ක්විජින් (J. Quiggin) ඔහු විසින් 2010 වසරේදී රචනා කරන ලද (Zombie Economics - How Dead Ideas Still Work) කෘතිය මගින් මනාව පෙන්වා දී ඇත.

1997 දී ඇතිවූ ආසියානු මූල්‍ය අර්බුදයත්, 2000දී ඇති වූ 'ඩොට්කොම්' බුබුල පුපුරා යාමෙන් පසු අර්බුදයත් 2008-2010 මූල්‍ය අර්බුදයත් නිසා නවලිබරල් නිර්බාධක වෙළඳපොළ සංකල්පයේ අසාර්ථකත්වය හොඳින්ම ඔප්පු විය. 2008 ලෝක ආර්ථික අර්බුදයත් සමග රාජ්‍යයේ මැදිහත්වීම ප්‍රතික්ෂේප කිරීම පුන පුනා දේශනා කළ නව ලිබරල් දර්ශනයට පටහැණිව දැවැන්ත රාජ්‍ය මූල්‍ය අරමුදල් යොදා බැංකු ක්‍රමය හා මූල්‍ය පද්ධතිය බිඳවැටීම වළක්වා ගැනීමට ධනපති පංතියට සිදුවිය. කෙසේ වුවද එහි මිල ගෙවීමටද සිදුවූයේ ඒ රටවලම දුප්පත් සාමාන්‍ය ජනතාවටමය.

## විකිණීමේ ජාත්‍යන්තර ප්‍රතිඵල

විකිණීම හා රජයේ මැදිවීම අත්හැරීම එකම සුපිරි, ගොඩයන මාවත යැයි අදහන රනිල් රාජපක්ෂ බැතිමතුන්ට මේ ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කළ රටවල ජාත්‍යන්තර අත්දැකීම් ප්‍රමාණයක් හැදෑරීම ඔවුන්ට කෙසේ වෙතත් වෙන විකල්ප නැතැයි තාමත් හිතා සිටින 'ජනතාවගේ කොටසට' වැදගත්ය.

2008 ඇමෙරිකන් මූල්‍ය වෙළඳපොළ කඩා වැටීමෙන් පසු එම වසරට අදාළ දත්ත අනුව ඇමෙරිකානුවෝ මිලියන 49.1ක් 'ආහාර සුරක්ෂිතතාවය අහිමි' කුටුම්භ ජනතාව ගණයට වර්ගීකරණය වූහ. එයින්ද මිලියන 17.3ක් ඉතාම දුර්වල කුටුම්භ ගණයට වර්ගීකරණය කර තිබුණේ, ඔවුන් සතුව මූලික ආහාර අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමටවත් මුදල් නොමැති නිසාය. ඒ කාලය තුළම සෞඛ්‍ය රක්ෂණයට දායකවීමට තරම් ආර්ථික ශක්තියක් නැති ඇමෙරිකානුවන්ගේ ප්‍රතිශතය මිලියන 46ක් දක්වා ඉහළ ගියේය. එය ඇමෙරිකානු ජනගහනයෙන් 15%ක් විය. ආර්ථික විද්‍යාඥ ක්වින්ග් පෙන්වා දෙන පරිදි ඇමෙරිකානු එක්සත් ජනපදයේ නිවාස රහිතවීම (Homeless) යනු මුළුමනින්ම වෙළඳපොළ නිදහස්කරණය වකවානුවේ පැන නැගි ප්‍රශ්නයකි. ඉන්පෙර නිවාස අහිමි වූ ජනතාව බොහෝ විට මහලුවීම, මත්ද්‍රව්‍ය පුරුදු, මානසික ආබාධ සහිත පිරිමි අතළොස්සකගේ ප්‍රශ්නයක් විය. 2007 වන විට නිවාස අහිමි ජනගහනය මිලියන 1.7ක් වූ අතර, ඉන් 40%ක්ම දරුවන් සහිත පවුල්වල සාමාජිකයන්ය.

## සැප දෙන්න විකිණීම

පුද්ගලීකරණය යොදා ගනිමින් රාජ්‍ය ආර්ථික කටයුතුවලින් නිදහස් වීමේදී ධනපති ආණ්ඩු ජනතාවට මතුරන ලද මන්ත්‍රයක් වන්නේ 'අපිට වෙනදාට වඩා හොඳින් ජීවත් වීමට හැකි වෙන්නේ රාජ්‍ය ආයතන විකුණූ පසුවය' යන්නයි. එය ලංකාවේ රාජපක්ෂ - වික්‍රමසිංහ පාලනයට මෙන්ම ධනවාදී නිදහස් වෙළඳ සුපිරි රාජ්‍යයන්ටද අදාළය. වෙළඳපොළ නිදහස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස දුප්පතුනට පවා රූපවාහිනියක්, ශීතකරණයක් මිලදී ගැනීමට පුළුවන් වීම කොතරම් දෙයක්දැයි ප්‍රලාප මතයක් ධනපති මාධ්‍ය විසින් නඩත්තු කරමින් සිටී.

මේ කුටුම්භ මෙවලම් ගැන සඳහන් කරන ආර්ථික විද්‍යාඥ ක්වින්ස් පෙන්වා දෙන්නේ, සාමාන්‍ය භාණ්ඩ මිලට සාපේක්ෂව එම භාණ්ඩවල මිල අඩුවිය හැකි බවයි. නමුත්, ප්‍රශ්නය වන්නේ, මෙවැනි මෙවලම් ලාභයට ගත හැකි වුවද, සෞඛ්‍ය, අධ්‍යාපනය, විවේකය වැනි ජීවිතයට වඩා වැදගත් බොහෝ දේවල් එතරම් ලාභයට ගත නොහැකි වීමයි. මිල අඩු කිරීමට අමතරව, ණයට දීම, වාරික ක්‍රමයට ගෙවීමට දීම ආදී උපක්‍රම මගින්ද ධනපති වෙළෙන්දන් ලාභදායක ව්‍යාපාර කිරීමට දක්ෂය.

සෞඛ්‍ය පහසුකම් අවශ්‍ය වන්නේ අසනීප වූ අයට මිස අතමිට මුදල් ඇතිව අසනීප වන අයට පමණක් නොවේ. දැන් මේ පුද්ගලීකරණයේ අවසාන අදියරේ සෞඛ්‍යය විකිණීමට උත්සාහ දරන්නේ මුදල් ඇති අයට පමණක් අසනීප වීමට හැකියාව ඇති කර අනික් ජනතාවට මිය යාම තෝරා ගැනීමටය. නමුත්, අවශ්‍ය වන්නේ වෙළඳපොළේ විකිණීමට නිදහස ඉක්මවා යන සමානාත්මතාවය සලකන පොදු ජනතාවට සේවයක් සහිත සෞඛ්‍ය සේවාවකි. අධ්‍යාපනයටද

11 වැනි පිටුවට

> සෞඛ්‍ය පහසුකම් අවශ්‍ය වන්නේ අසනීප වූ අයට මිස අතමිට මුදල් ඇතිව අසනීප වන අයට පමණක් නොවේ. දැන් මේ පුද්ගලීකරණයේ අවසාන අදියරේ සෞඛ්‍යය විකිණීමට උත්සාහ දරන්නේ මුදල් ඇති අයට පමණක් අසනීප වීමට හැකියාව ඇති කර අනික් ජනතාවට මිය යාම තෝරා ගැනීමටය.



"ඔබ සාධාරණ නිසා ලෝකය ඔබට සාධාරණ වනු ඇතැයි සිතන්නේනම් ඔබ ඔබවම මෝඩයෙක් කර ගනී. එය හරියටම ඔබ සිංහයන් නොකන නිසා සිංහයන් ඔබව නොකනු ඇතැයි බලාපොරොත්තු වීම වැනිය."

**චානක්‍ය (කෞටිල්‍ය)**



# හදිසියේ ආ අයිස්

**"තාත්තෙ මට අයිස් ඕනේ"**
**"පුතේ ඔයාට මොන ජාතියෙ අයිස්ක්‍රීම් එකක් ද ඕනේ?"**
**"මට ඕනේ අයිස්ක්‍රීම් නොවෙයි. අර ඒක ගත්තාම පාවෙනවා කියල ටීවී එකේ මාමලා කිව්වේ. අන්න ඒ අයිස් ඕනේ."**

මෙය සමාජ මාධ්‍ය තුළ සංසරණය වූ වීඩියෝවකින් උපුටා ගත්තකි. එය සත්‍ය කතාවකි.

පාසල් දරුවන් අතර අයිස් මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාම පිළිබඳව බොහෝ ප්‍රවෘත්ති අසන්නට ලැබුණි. විශේෂයෙන් සමහර මාධ්‍යයන් ඔස්සේ මේ පිළිබඳ වඩ වඩාත් කතාබහට ලක්කරන ලදී. මත්ද්‍රව්‍ය භාවිතා කළ පාසල් සිසු සිසුවියන් ඒ මත්ද්‍රව්‍ය භාවිතා කළ අයුරු, මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් පසු සිදුවන දේ මාධ්‍යයන් ඔස්සේ ප්‍රචාරය කෙරුණි. ඒ දකින අනෙකුත් දරුවන්ද භාවිතයෙන් පසු පාවෙන තත්වයකට පත්වෙන අයිස් මත්ද්‍රව්‍ය ලබා ගැනීමට පෙළඹවීමක් ඇතිවීම ස්වභාවිකය. සාමාන්‍යයෙන් පාසල් යන වයසේ දරුවෝ නිතරම කුතුහලයෙන් ජීවත්වෙති. ඒ නිසාම ඔවුහු විවිධ දේ අත්හදා බලන්නට පෙළඹෙති. විශේෂයෙන් අවුරුදු 16, 17, 18 වැනි වයස්වල දරුවන් මේ සඳහා වැඩි වශයෙන් පෙළඹෙන බව ලෝකයේම නිරීක්ෂණයට බඳුන්වූ කරුණකි. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ඉලක්කය පාසල් දරුවන් වෙත යොමු වන්නේ මේ ජීව විද්‍යාත්මක කාරණා පදනම් කරගෙනය. පසුගිය වසර 3 පුරාවටම පාසල් අධ්‍යාපනයේ සිදුවූ බිඳවැටීමත් සමගම පාසල් දරුවන් විශාල වශයෙන් තාක්ෂණය හා සම්බන්ධව කටයුතු කරන්නට පෙළඹුණෝය. මේ පෙළඹවීම මතද මත්ද්‍රව්‍ය ව්‍යාප්ත කර ගැනීම පහසු වූවාට සැක නැත. පසුගිය කාලවලදී අපිට වැඩිපුර දක්නට ලැබුණේ හෙරොයින්, ගංජා වැනි මත්ද්‍රව්‍යවල ව්‍යාප්තියයි. නමුත් මෑත කාලයේ අයිස් මත්ද්‍රව්‍ය විශාල ලෙස ව්‍යාප්ත වන බව දක්නට ලැබේ. මේ අයිස් මත්ද්‍රව්‍යවලට වැඩි වශයෙන් ගොදුරු කරගන්නේ පාසල් දරුවන්ය. පාසල් යන වයසේ පිරිමි දරුවන් හා සමානවම මෑත කාලයේ ගැහැනු දරුවන් ද අයිස් මත්ද්‍රව්‍යයට ඇබ්බැහිවී ඇති ප්‍රමාණය ඉහළ ගොස් ඇති බව ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන් විසින් පසුගියදා පවසා තිබුණි. පාසල් ආශ්‍රිතව පැතිර යන මත්ද්‍රව්‍ය බෙදා හැරීම සඳහාද පාසල් පරිසරය තුළින්ම පුද්ගලයන් තෝරා ගැනීමට ජාවාරම්කරුවෝ සූක්ෂම වෙයි.

හොරණ, මිල්ලනිය ප්‍රදේශයේ පාසල් සිසුවෙකු විසින්ම අනෙකුත් පාසල් දරුවන්ට අයිස් මත්ද්‍රව්‍ය බෙදා හැර තිබුණි. තවත් විටෙක උපකාරක පන්ති ගුරුවරයෙකු යොදාගෙන සිසුන් අතර මත්ද්‍රව්‍ය බෙදාහැරීම සිදුකර තිබිණි. ඒ අතරම පාසල් ආපන ශාලා තුළ අයිස් මත්ද්‍රව්‍ය තිබී සොයා ගන්නා ලදී. පාසල් දරුවන් රස විඳින්නට ආශා කරන Lolipop ආකාරයට මත්ද්‍රව්‍ය සාදා විකුණූ පුවතක්ද අපි දුටුවෙමු.

පෙර, නාගරික පාසල්වලට පමණක් සීමාවූ මත්ද්‍රව්‍ය වර්තමානය වන විට ග්‍රාමීය පාසල්වලට ද ව්‍යාප්තවී ඇති බව දක්නට ලැබේ. විශේෂයෙන් උතුරු නැගෙනහිර පාසල් තුළද ශීඝ්‍ර ලෙස මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සිදුවන බවට තොරතුරු දිනපතා ලැබේ. මෙය නොසලකා හැරිය යුතු තත්වයක් නොවේ. සිදුවීමක් දුටු පමණින් අනේ! අපොයි! කියා ඉවත බලා ගත යුතු තත්වයක් නොවේ.

මේ අනුව සමාජයේ ඇති සමාජ ආර්ථික ප්‍රශ්න හේතුකාරණා කොටගෙන මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සිදු කිරීමට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් කටයුතු කරන අයුරු දක්නට ලැබේ. මෙමගින් සමාජයේ ජීවත්වෙන අනේකවිධ ගැටලුවලට මුහුණ දෙන ජනතාවට තවත් අලුත් ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදුව තිබේ. 2023 අය වැය යෝජනා වලට අනුව වක්‍ර බදු ලෙස රුපියල්  කෝටි විසි එක් දහස් අටසියයක් ජනතාවගෙන් අය කර ගැනීමට ආණ්ඩුව තීරණය කර තිබේ. ඒ අනුව ගණනය කළ විට එක් පුද්ගලයෙකු ගෙන් දිනකට රු276ක් අය කර ගැනීමට ආණ්ඩුව සූදානම් වේ. මේ මොහොත වන විටත් රටේ ජනගහනයෙන් 76%ක් ආහාර අනාරක්ෂිතභාවයෙන් මෙන්ම 73%ක් ආහාරවල පෝෂණය නොසලකා ලැබෙන ඕනෑම දෙයකින් කුස පුරවා ගන්න තැනට පත්ව ඇතැයි වාර්තා වේ. මේ හේතුන් නිසාම මන්දපෝෂණය 15%කින් පමණ වැඩි වී ඇති බව ආණ්ඩුවට සම්බන්ධ පුවත් පත් විසින්ම පෙන්වා දී තිබේ.

එසේම මේ මොහොත වන විට පාසැල් උපකරණවල මිළ තුන් ගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ. මීට මාස 6 කට පමණ පෙර පිටු 200 CR පොතක් මිළ රුපියල් 230ක් වුවද අද වන විට එය රුපියල් 510ක් දක්වා ඉහළ ගොස් ඇත. සපත්තු, බෑග්, වතුර බෝතල්, ඇදුම් ආදියේ මිලද තුන් ගුණයකින් පමණ ඉහළ ගොස් තිබේ. මේ තත්වය තුළ දරුවන්ට පාසැල් යෑම නොව ජීවත් වීම පවා අර්බුදයක් බවට පත් වී අවසන්ය.

දැන් ප්‍රසිද්ධ මාධ්‍ය ඇතුළු සෑම තැනකම සෑම කෙනෙකුම කතා-බහ කරන්නේ පාසල් තුළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ගැනය. පාසල් ළමුන්ගේ බෑගයන් තුළ මත්ද්‍රව්‍ය සොයන පොලිස් නිලධාරීන් ගැන තොරතුරු අපට අනාවරණය වේ. අපි ඒවා මාධ්‍ය තුළින් දකිමු. සැබැවින්ම පාසල් දරුවන්ගේ බෑග් තුළ මත්ද්‍රව්‍ය සෙවීමෙන් මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය වළකාලිය හැකිද? මොළයක් ඇති ඕනෑම කෙනෙකුට මෙයට නිවැරදි පිළිතුරු ලැබේ. ඇත්ත වශයෙන්ම සිදුවිය යුත්තේ මත්ද්‍රව්‍ය මෙරටට ගෙන්වන ක්‍රමවේද නවතා දැමීමයි. එක්කෝ මුහුදු මාර්ගයෙන්, එසේත් නැතනම් ගුවනින් මෙරටට මත්ද්‍රව්‍ය පැමිණේ. මේවා ලංකාව තුළ නිෂ්පාදනය කරන්නේ නැත. ඒවා එන්නේ විදේශයන්ගෙනි. එනිසා විදේශයන්ගෙන් මෙරටට පැමිණෙන මාර්ග වසා දැමීම සිදුවන්නේ නම් මත්ද්‍රව්‍ය පාසල් දරුවන්ගේ බෑග් තුළට පැමිණෙන්නේද නැත. පාලකයෝ තම දේශපාලනය රැක ගැනීම වෙනුවෙන් ජාවාරම්කරුවන්ගේ උපකාර ලබති. දේශපාලන රැකවරණය ඇතිව මත්ද්‍රව්‍ය මුදලාලිලා රට තුළ යෙහෙන් වැජඹෙයි. රටේ ජනතාව විසින් කුඩු මුදලාලිලා පාර්ලිමේන්තුවට එවා ඇත. එනිසා දේශපාලන හයිය ඇතිව මත්ද්‍රව්‍ය මෙරට තුළට පැමිණෙයි. සංසරණය වෙයි. නමුත් තෝරු මෝරු ඔක්කොම ඉතුරු කර පොලීසිය හා අධ්‍යාපන බලධාරීන් හාල්මැස්සන් සොයමින් හිඳියි. මේ දුර්දාන්ත පාලකයන් රටේ එකදු හෝ ප්‍රශ්නයකට විසඳුම් නොදෙන බව මේ වන විට ජනතාවට අවබෝධ වී තිබිය යුතුය පාසැල් උපකරණවල මිළ අධික ලෙස ඉහළ යෑම. ළමුන්ගේ මන්ද පෝෂණ තත්වය වර්ධනය වීම ආදී ගැටළු යටපත් කරමින් මේ තකහනියේ පාසල් තුළින් අයිස් මත්ද්‍රව්‍ය  හමුවන්නේ කුමක් නිසාද? මෙය කූට දේශපාලන බල ව්‍යාපෘතියක තවත් එක් උපක්‍රමයක් විය නොහැකිද?

අපට එසේ සිතන්නට බොහෝ හේතු කාරණා ඇත. ඉතිහාසයේ මේ ආණ්ඩු බලයට පත්වෙන්නට විවිධ ප්‍රශ්න රට තුළ ඇති කළ බව නොරහසකි. ජනතාවගේ මළ මිනී මතින් බලයට ආ පාලකයන්ට බලය වෙනුවෙන් පාසල් දරුවන් බිල්ලට ගැනීම ද එතරම් අපහසු දෙයක් නොවේ. වඳ කොත්තු, වඳ බ්‍රා ජවනිකාවේ තවත් එක් කතාංගයක් ලෙස අයිස් වේදිකාගත වූවා වන්නට බැරි නැත. දැන් හැමෝම කතා කරන අයිස්, උවදුරකි. ඒ උවදුර නිසා දෙමාපියන් ඉන්නේ දැඩි සිත් තැවුලෙනි. තම දරුවා මත් රකුසාගෙන් බේරා ගන්නේ කෙසේ දැයි ඔවුන්ට ඇති දැවෙන ප්‍රශ්නයකි. ඒ නිසා අයිස්වලින් දරුවන් බේරා ගත හැකි විරුවෙකුට රට බාරදෙන්නට අම්මලා පෝලිමේ ගොස් ඡන්දය දෙන්න පෙළඹෙන්නටද බැරි නැත. මේ සියලුම දේ සමාජ ආර්ථික දේශපාලන අර්බුදය විසින් නිර්මාණය කළ ඒවා බව අවබෝධ කර ගන්නට ජනතාව සමත් වන්නේ නම් එය ජයග්‍රහණයකි. එසේ නොවන පිරිසට අවබෝධ කරවීම අද මෙන්මම හෙටත් අපට අත් හළ නොහැකි වගකීමකි.



# බේදවාචකයෙන් බේරීමට පෙරමුණ ගත යුතුයි

**චන්ද්‍රමාලි පෙරේරා**
ගම්පහ දිස්ත්‍රික් සංවිධායිකා
අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය

74 වසරක සාපයේ එල අද අපි මරියානා අගාධයටත් වඩා ගැඹුරින් භුක්ති විඳිමින් සිටිනවා. දේශපාලන අර්බුදය සමාජමය අර්බුදයක් බවට පරිවර්තනය වෙලා.

දරුවන්ට පෝෂ්‍යදායි ආහාරයක් තබා තුන්වේල කුස පිරවීමට බත්පත සොයා සටනක යෙදෙන මව්පියන් අතින් නිතැතින්ම මඟහැරෙන දරුවා බිලි ගන්න මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඇස් මානාගෙන ඉන්නවා.  අහසින්, මුහුදින් එන මත්ද්‍රව්‍ය නැවැත්වීමට වැඩපිළිවෙලක් නොමැතිව දරුවන්ගේ පාසල් බෑග් පරීක්ෂා කිරීම අද හාස්‍යජනක කාරණයක් වෙලා. ඒ වගේම ඒවා මාධ්‍ය සංදර්ශන බවටත් පත්වෙලා.

දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ජීවිතයම දිය කළ දෙමව්පියන්ට පාසල් උපකරණවල අධික බර දරාගත නොහැකි තත්වයකට පත්වෙලා ඉවරයි. ඒ කියන්නේ මේ තුච්ඡ පාලනය දරුවන් අධ්‍යාපනයෙන් පිටමං කරන තත්වයට පත් කරලා.

මෙම බේදවාචකයෙන් ගැලවීමට නම් ජනතාවාදී පාලනයක් ගොඩනැගීම අනිවර්යයක්. ඒ නිසා  ජනගහනයෙන් 52%ක් සේම ඡන්දදායකයින්ගෙන් 56%ක් නියෝජනය කරන කාන්තාවන්  වන අප මේ සඳහා පෙරමුණ ගත යුතු නොවේද?



## යුගය අවසන් කරමු නිරතුරුව අප දැවූ

අවුරුද්ද පිළිගන්න වෙනද  ඇහෙන සද්ද
නැති කමින් නව වසර උදාවෙන්නැති වෙද්ද
ගිමන් කළ කොළ හැලී පාළු වුවත් බැද්ද
කටු පඳුරු මත වුවත් මලක් පිපුණොම නැද්ද

තුන් වේල කන්න නැහැ කුසගින්න දරාගෙන
දරුවන්ගෙ පාට කළ හීන බොඳකරගෙන
අදක් ගැන පැතුම් පොදි තිබුණ මුත් පුරෝගෙන
හෙටක් ගැන අදිටනින් හිඳිමු අපි බලාගෙන

ජනේරුව පිළිගන්න කිරිබතක් නැති වුණත්
නැවුම් හැඟුමන්වලින් පිරී ඉතිරෙමු හෙටත්
අහිමි කළ ජීවිතේ දිනාගන්නට  යළිත්
දහස් ගණනින් එක්ව රොඳ බිඳිමු අපි තවත්

හැත්තෑ පස් වසරක්ම උන්ට කිරිබත් ඉයූ
වත්ත බද්දට පුදා ඇස්සකට දත නියූ
උපන්බිම නොරටුන්ට හොරෙන් උගසට තියූ
යුගය අවසන් කරමු නිරතුරුව අපි දැවූ

# සමාජ වෙළඳපොළ ආර්ථිකය

## අලුත් එකක්ද? තියෙන එකමද?

*පවතින ආර්ථිකය සහ සංවාදයට බඳුන්වන සංකල්ප පිළිබඳව ආර්ථික විද්‍යාත්මක ඇසකින් බලන ලිපි පෙළක් මෙවර කලාපයේ සිට ඇරඹෙයි.*



"තමන්ගේ සියලු වැරදි සහ ශක්තීන් සහිත මනුෂ්‍යයෝ සමාජ ව්‍යාපාරයක යාන්ත්‍රණය සංයුක්ත කරති. ඔවුන් වැරදි කළ යුතුය. එසේම වැරදිවලින් පාඩම් උගත යුතුය. වඩ වඩාත් වැරදි කළ යුතුය. එම වැරදිවලින් අලුතින් උගත යුතුය. ඔවුන් ජයග්‍රහණය මෙන්ම පරාජයද රස බලා, ඒ එක් එක් අවස්ථාව සමග ජීවත්වන්නේ කෙසේදැයි සොයා ගත යුතුය. කාලය සහ ක්‍රියාව ගුරුවරුන්ය."

**මාටින් ලූතර් කිං**

මේ දිනවල සමගි ජන බලවේගය තමන්ට පාලනයක් ලැබුණ පසු ක්‍රියාවට නැගීමට සිටිනා ආර්ථික මොඩලයට දෙන නම 'සමාජ වෙළඳපොළ ආර්ථිකය'යැයි කියමින් සිටී. (Social market economy) මේ ගැන කවුරුන් එතරම් තැකීමක් නැත්තේ උස-මිටි අනුව රැකියා දෙන තරමේ සරල ක්‍රමයක් යැයි සිතා විය හැකිය. නමුත් මෙවැනි සමාජ ක්‍රමයක් හෝ ආර්ථික මාදිලියක් (Model) කලින් පැවැති එකක්ද? නව ආර්ථික මොඩලයක්ද? එසේත් නැත්නම් ලෝකයේ මෙතෙක් නොපැවතුණු අලුත්ම ආර්ථික මොඩලයක්ද? මේ පිළිබඳව න්‍යායික කියවා ගැනීමක් සිදුකිරීම සුපුරුදු ලෙස රැවටීමට ලක්විය හැකි සමාජයක් ගලවා ගැනීමේ ප්‍රතිකාරයක් විය හැකිය.

### සමාජ වෙළඳපොළ - ඉතිහාසය

1945 දෙවන ලේක යුද්ධය අවසන් වීමට පෙර ජර්මනියේ පැවැතියේ 'නාසි සෝෂලිසම්' හෙවත් තනි ඒකාධිපති හිට්ලර්ගේ පාලනයයි. නාසිවාදය හඳුන්වන්නේ ජාතික සමාජවාදය (National Socialisem) ලෙසයි. එහි සමාජවාදයක් නොතිබිණි. පැවැතියේ ඉතාලියේ බලය ලැබූ, බෙනිටෝ මුසෝලිනි ක්‍රියාත්මක කළ ලෙසටම ජර්මනියේ බලය ලබා ගැනීමට ඇඩෝල්ෆ් හිට්ලර් අනුගමනය කළ වැඩපිළිවෙළ සහ මතවාදයයි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු හිට්ලර් සමගම නාසිවාදයටද ඉදිරියට යාමට ඇති ඉඩ වැළකිණි. ඉන්පසු බ්‍රිතාන්‍ය ක්‍රමයේ නිදහස් වෙළඳපොළ ආර්ථික මොඩලයට මාරුවීම වෙනුවට ජර්මනියේ පාලක ලුද්වික් තෝරාගත් ධනේශ්වර ආර්ථික මොඩලයේම තවත් ආකෘතියක් වූයේ සමාජ වෙළඳපොළ ආර්ථික මොඩලයයි. 'සැමට සෞභාග්‍යය, සැම අයෙකුටම දේපළ' (Prosperity for all property for all) මෙම ක්‍රමයේ සංකල්පය විය. නිදහස් වෙළඳපොළ ආර්ථික කටයුතු රජය මගින් නියාමනය කරමින් දැනටමත් පවතින මිශ්‍ර ආර්ථිකයන් ලෙස හඳුන්වන (Mix Economy) ධනවාදී ආර්ථිකයන්ගේම අංග ලක්ෂණ සහිත ධනේශ්වර ආර්ථිකයම හඳුන්වන තවත් නාමකරණයකි, සමාජ වෙළඳපොළ ආර්ථිකය.

### සමාජය සහ සමාජ වෙළඳපොළ

අපි දේශපාලන ආර්ථික විද්‍යාව හැදෑරීමේදී සමාජයක් හා ඒ සමාජයේ පවතින මානව සබඳතාවන්ගේ ස්වභාවය, පංති බලවේග පිළිබඳව හදාරන්නේ ඓතිහාසික භෞතිකවාදී ක්‍රමවේදයට අනුවය. එහිදී නිෂ්පාදන සම්බන්ධතාවයන්ගේ සංවර්ධනය ඓතිහාසික සංවර්ධන තුළ හඳුනාගත යුතුය. සමාජය තේරුම් ගැනීමේදීත් ඒ කරුණ අමතක කළ නොහැකිය. ඒ අනුව සමාජ ආර්ථිකය නිර්මාණය වීමේදී එකක් ඉවත් කරමින් තවත් සමාජ ක්‍රමයක් ඒ ස්ථානය අත්පත් කරගනිමිනි. මෙම ක්‍රියාවලිය ඉදිරියට ගමන් කරන්නේ නියාම පාලිත ක්‍රමවේදයකට මිස කිසිවෙකුගේ හිතලුවකට හෝ නම් කිරීමකට අනුව නොවේය. එසේ සමාජ ආර්ථිකයක් ඉවත් කර, තවත් සමාජ නිෂ්පාදන රටාවක පැවැත්මට පැමිණීමට හේතු ඇත. ඒ ප්‍රධාන නියාමය වන්නේ ද්‍රව්‍යමය වටිනාකම නිෂ්පාදනයේ ස්වභාවයයි. නිෂ්පාදන බලවේග හා සබඳතා සංවර්ධනය වීමයි.

### සමාජ සංවර්ධන නියාමය

සමාජයක් යනු රංචුවක් නොවේය සතුන් රංචු මිස සතුන් සමාජයක් නොවන්නේය. රංචුව සහ සමාජය අතර ඇති වෙනස වන්නේ නිෂ්පාදන ක්‍රියාවලියක් මත පැවතීම හා සංවිධානය වීමේ සවිඥානක අරමුණයි. සතුන් රංචුව ආහාර අවශ්‍යතාවයට එක්ව කටයුතු කරයි. එය ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක ප්‍රතිඵලයක් මිස සවිඥානක (කලින් දැනුවත්ව සූදානම් වූ) ක්‍රියාත්මක වීමක ප්‍රතිඵලයක් නොවේය. මිනිස් සමාජය එසේ නොවේ. එය ආහාර, නිවාස, අධ්‍යාපනය ඇතුළු තම මූලික අවශ්‍යතාවයේ සිට සංකීර්ණ වුවමනාවන් තෘප්තිමත් කර ගැනීම දක්වාම සවිඥානක සංවිධානය වේ. එවිට එය රංචුවෙන් වෙනස් වන සමාජය ලෙස හැඳින්වේ.

### සමාජ වෙළඳපොළ ආර්ථිකය - Social Market Economy

සමාජ වෙළඳපොළ ආර්ථිකය මුලින්ම බටහිර ජර්මනියේ ප්‍රවර්ධනය කරන ලද්දේ 1949දී ජර්මනියේ චාන්ස්ලර් කොන්රාඩ් ඇඩිනෝවර් යටතේ ජර්මානු ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමය විසිනි. අද මෙම 'සමාජ වෙළඳපොළ ආර්ථිකය' යෙදුම පූර්ණ රාජ්‍ය මැදිහත්වීම ප්‍රතික්ෂේප කරන නව ලිබරල් සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම විසින් නිරන්තර භාවිත කරනු ලබයි.

සමාජ වෙළඳපොළ සංකල්ප බිහිවීමේදී ධනවාදයේ ලැයිසෙස්-ෆයාර් (Laissez - Faire) ආකාරයේ සහ සමාජවාදී ආර්ථික මොඩලයේ අතරමැදි අවස්ථාවක් ලෙස ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන දෘෂ්ටිවාදී බලපෑමට ලක්ව ඇත. බෙදාහැරීම්වාදය (Distributism) සහ ඔඩෝලිබරල්වාදය (Ordoliberalism) සංකල්පයන් මෙම මතවාදය පෝෂණය කිරීමට ඉවහල් වී ඇත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පවල ආභාෂය ලැබුවද සමාජ වෙළඳපොළ ආර්ථික ව්‍යුහය පුද්ගල හිමිකාරිත්වය වෙනුවට සමාජමය හිමිකාරිත්වය පිළිනොගනී. එසේම ආර්ථිකය සැලසුම්කරණය සහ සමාජවාදී දේපළ අයිතිය පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශය ප්‍රතික්ෂේප කරයි.

වෙළඳපොළ බලවේගය නිදහස් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය යටතේ බාධාවකින් තොරව පැවැතිය යුතු බව පිළිගන්නා අතර, මුදල්, ණය, වෙළඳාම, බදු, රේගු, ආයෝජන හා සමාජ ප්‍රතිපත්තිය ඒකාබද්ධ කරමින් ජනගහනයේ සුබසාධනය හා අවශ්‍යතා ඉටුකරන ආර්ථිකයක් නිර්මාණය කිරිම මෙම සමාජ වෙළඳපොළ ආර්ථික මොඩලයේ අරමුණු ලෙස න්‍යායිකව පැහැදිලි කරයි.

සමාජ වෙළඳපොළ ආර්ථිකයක ලක්ෂණ වන්නේ රාජ්‍ය මැදිහත්වී සිදුකරන කළමනාකරණය මගින් අර්බුදයන් විසඳිය හැකිය යන්නයි. ලෝකයේ පුරාම නිදහස් තරගය විසින් නිර්මාණය කළ අධිනිෂ්පාදන අර්බුදයන් සමග මීට සමාන්තර රාජ්‍ය සුබසාධන ධනවාදී ආර්ථික මොඩලයන් ක්‍රියාවට නැගුණේද මේ වකවානුවේමය.

නමුත් ධනපති ක්‍රමයේ නිසඟ ලක්ෂණය නිෂ්පාදන අරාජිකත්වය, නිෂ්පාදනයේ එක් එක් අංශ අතර සමානුපාතිකයන් බිඳ වැටීම, ලාභ අනුපාතිකයන් කඩා වැටීම වැළැක්විය නොහැකිය.

1973 වන විටම රාජ්‍ය සුභසාධන ධනවාදය අර්බුදයට ලක්විය. ඉන් අනතුරුව පැමිණියේ නව ලිබරල් ධනවාදයයි. එනම්, රජය ආර්ථික කටයුතුවලින් ඉවත්වී වෙළඳපොළ බලවේග යන්ට රිසි සේ ආර්ථිකයන් හැසිර වීමට ඉඩ දිය යුතු බවට වන මතවාදයයි. එම ආර්ථික මොඩලයට ජනතා ප්‍රශ්න විසඳිය නොහැකිය. දැන් ජනතාවට ඇත්තේ අලුත් අසාර්ථකත්වය අතහැර පැරණි අසාර්ථකත්වය යළි වැළඳ ගන්නේද යන ප්‍රශ්නයයි.

සමහර ආර්ථික විචාරකයින්, සමාජ ධනවාදය (Social capitalism) යන යෙදුමද රයින් ධනවාදය (Rhine Capitalism) ලෙසද මෙම ආකෘතියම පැහැදිලි කරයි. ඇන්තනි ග්ලිඩන්ගේ තුන්වන මාවත, ලන්දේසි පොල්ඩර් ආකෘතිය, ජපන් නැගෙනහිර ධනවාදී ආකෘතිය සහ වත්මන් චීනයේ සමාජ වෙළඳපොළ ආර්ථිකයටද මෙම නාමය සමාන කිරීමට උත්සාහ දරයි. මෙම සංකල්පය තවත් වර්ධනය කරමින් 'පාරිසරික සමාජ වෙළඳපොළ ආර්ථියක්' (Eco-social economy) මෙයම වර්ධනය කර ඇත. (මෙවැනි ආර්ථිකයක් ඇති රටවල් ලෙසට දැනට ඔස්ට්‍රියාව, චෙක් ජනරජය, පෝලන්තය, ජර්මනිය, එක්සත් රාජධානිය ධනේශ්වර ආර්ථික විශ්ලේෂකයෝ උදාහරණ ලෙස දක්වති.

> ජනතාවගෙන් දිනපතා ප්‍රතික්ෂේප වෙමින් සිටින ධනපති පාලකයින් ජනතාව තව දිනයක් හෝ රවටා බලයේ සිටීම සඳහා තමන් මෙතෙක් කර තබාගෙන පැමිණි ධනවාදී ආර්ථික ක්‍රමයම කොතරම් දිරාපත් වෙමින්, විනාශ වෙමින් ගියද ඒ සඳහා අලුත් නම් යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරයි.



### ආර්ථික මොඩලය තීරණය කරන සාධකය

ඕනෑම රටක ආර්ථික මොඩලය තීරණ කරන ප්‍රධාන නිර්ණායකය වන්නේ එම ආර්ථිකයේ නිෂ්පාදන බලවේගයන්ගේ හිමිකාරිත්වය දරන්නේ කුමන පංතියද යන්නයි. සෑම සමාජ ක්‍රමයකදීම නිෂ්පාදන බලවේගයන්ගේ අත්පත් කරගන්නා සංවර්ධන මට්ටම විසින් ඊට අනුරූපී නිෂ්පාදන සම්බන්ධතාවයක් ඉල්ලා සිටී. එය මාක්ස්වාදී දර්ශනය විසින් සොයා ගන්නා ලද සත්‍යයයි. සමාජ සංවර්ධනය ඉතිහාසය පුරා, පහළ මට්ටම්වල සිට ඉහළ නූතන සමාජ මට්ටම දක්වාම පවතින වර්ධනයේ මූලික නියාමය එයයි.

මානව වර්ගයා අඛණ්ඩව ප්‍රගතිය කරා මිස ආපසු ගමනක් ඇත්තේ නැත. ඓතිහාසික පරිදර්ශකය (Panorama) එබඳුය. ප්‍රාථමික සාමූහික සමාජයේ සිට වහල් ක්‍රමය දක්වාත්, ඉන්පසු වැඩවසම් ක්‍රමය (යුරෝපයට සමාන්තරව ආසියාවේදී ආසියාතික ක්‍රමය ලෙසින්) එතනින් ධනවාදය දක්වාත්, කොමියුනිස්ට් නිෂ්පාදන මාදිලිය දක්වාම මෙම ප්‍රගතිශීලී ගමන සිදුවේ.

### ධනවාදී ක්‍රමය හා සමාජ වෙළඳපොළ මොඩලය

පැවැති සමාජ ක්‍රමයන්ගේ ඉතිහාසයට සාපේක්ෂව ඉතා කෙටි ආයුෂ කාලයක් ගත කලද පැවැති සමාජ ක්‍රමයන්ට වඩා දැවැන්ත ඉදිරි ප්‍රගතියක් අත්පත් කරගන්නා ලද සමාජ ක්‍රමයකි ධනවාදය. ඒ කෙටි කාලය තුළ විද්‍යාව හා තාක්ෂණය ක්ෂේත්‍රය තුළ මිනිස් ශ්‍රමය විසින් බිහිකළ අදහාගත නොහැකි නිර්මාණයන්ගේ ප්‍රතිඵල විසින් අතිමහත් නිෂ්පාදන බලවේගයන් බිහිකර ඇත. නමුත් එම බලවේගයන්ට ගැලපෙන අනුරූප නිෂ්පාදන සබඳතාවයන්ගේ යල් පැනයාම විසින් අර්බුදයක් නිර්මාණය කර ඇත.

11 වැනි පිටුවට

# පෝ ලිටිකල් පංතිය

පොලිටික්කා සුපුරුදු පරක්කුවෙන් පංතියට ආවට වෙනස්කමක් තිබුණා. උදේ කඩාගෙන වැටුණු වැස්සට අහුවෙලා තෙත බරිත වෙලා. හම් මල්ලට වැටුණු වැහි වතුර බිංදුවලට අතින් ගහගෙන ආවෙ පිහදානවටත් වඩා වැස්සට තඩිබාන කේන්තියෙන් වගේ.

"ගුඩ් මෝනිං සර්" වසන්තියයි අනුරුද්දියයි කතාවෙලා වගේ එකටම කිවුව.

"මොන ගුඩ්ද ළමයිනේ... දවස පටන් ගත්තෙම මේ කරුම වැස්සකට අහුවෙලානෙ" පොලිටික්කගෙ මූණ බෑඩ් නෙමෙයි, වර්ස්ට්.

"අපරාදෙ සර්... වැස්සට පැන්නෙ... සර්ට තිබුණෙ ගෙදරින් පරක්කු වෙලා එන්න" ඩෙස් එකට ඔළුව තියාගෙන නින්දෙයි සැප නින්දෙයි වෙනස තෝරපු කනිය පොඩ්ඩක් ඔළුව උස්සන ගමන් කිවුව.

"කොහෙද... මං එළියට බහිනකොට වැස්සක නාමයක් තිබ්බෙ නෑනෙ" පොලිටික්ක අහසට සාප කරනව වගේ ජනේලෙන් අහස දිහා බැලුව.

"වැස්ස පටන් ගන්නකොටම බයික් එක නවත්තල රේන් කෝට් එක දාගත්තනම් ඉවරයිනෙ... සර්" චමියගෙන් විශේෂඥ උපදෙස්.

"ඔය ළමය කියන්න ඕනෙ නෑ එහෙනම් මම දාගන්නව... ඊට කලින් රේන් කෝට් එක උස්සපු එකාගෙ අඬු කඩල ඉන්නත් ඕනෙ" පොලිටික්ක මිට මෙලෙව්ව විදියට චමියත් බය වුණා. "තව එකක් ගන්නත් බෑ... පුදුම ගණන්නේ"

"හරි ඉතින් සර්ට තිබුණානෙ බයික් එක කඩේකට අල්ලන්න..." වැස්සෙන් බේරුණාත් මංජුවගෙන් බේරෙන්න බෑ වගේ.

"ඔව්... ඕව්... යන්තම් තෙමෙනකොට කඩේකට ඇල්ලුවා. වැස්සට එකතු වුණු කීපදෙනකුත් හිටිය. මාත් කතාවට වැටුණා. ඒත් මට ඇල්ලුවෙ නෑ උන්ගෙ කතාව" පොලිටික්ක ළඟ නැමුව.

"ඉතින් සර් වැස්ස කියල බලන් නැතුව පාරට පැන්නා?" කනියට ඔළුව උස්සන්නම වුණා... "අපරාදෙ වලියට යන්නෙ නැතුව ඉන්න තිබුණෙ"

"මාත් රංඩු වෙන්න හිටියෙ නෑ. ඒත් මං ඇරියෙ නෑ... උන්ට තේරුන් කරන්න හැදුවා... රට තියන තත්වෙ. උන් තේරුම් ගත්තෙ නෑ" පොලිටික්ක බොක්සිංවලට වගේ අත් දෙකම මිට මොලවගෙන.

"වලිය සැරට ඇවිළුණාද සර්? ...තවත් එතන ඉන්න බැරි වෙන්න" චමිය තත්ව වාර්තාවක් ගන්නව.

"මොකද්ද සර් ඇති වෙච්ච කතාව... ඔය තරම් සැරට යන්න..." සමන කොණක් පාදගන්න බැලුව.

"නෑ ළමයිනේ... ඒක ඒ තරම් දෙයක් නෙමෙයි" පොලිටික්ක වැඩේ වහන්නමයි හදන්නෙ.

"නෑ සර්... ඒ තරම් දෙයක් නෙමෙයිනම් ඇයි සර් බය වුණේ... මහ වැස්සෙ කඩෙන් එළියට පනින්න තරම්" මංජුවගෙන් බේරෙන්න බෑ... පරණ තුවාලෙ කොනිති ගහනව.

"නෑ මම උන්ගෙ කතාවට බය වුණේ නෑ. උන් දේශපාලන විද්‍යාව දන්නෙත් නෑ ආර්ථික විද්‍යාව දන්නෙත් නෑ..." පොලිටික්ක සිවිලිම දිහා බලාගෙන හිනා වුණා.

"ආ... සර්... කතාව දිග්ගැස්සුණේ ඡන්දෙ ගැන නේද?" සමන ජේනයක් බැලුව.

"ඔය ළමය කොහොමද කියන්නෙ" පොලිටික්කගෙ මූඩ් එක වෙනස් වුණා.

"නෑ ඔය දෙකම ගැන කතා වෙනවනම් දැන් මාතෘකාව ඡන්දෙ තමයි" සමන ටක්කෙටම කිවුව.

"සමන්ගේ අනුමානෙ හරි" පොලිටික්කට පිළිගන්න සිද්ධ වුණා... "කතාව ඇවිස්සුණේ ඡන්දෙ ගැන තමයි"

"මං කිවුව ඡන්දෙ තියන්න රටේ සල්ලි නෑ කියල" පොලිටික්ක ඒ අවාසනාවන්ත මොහොත මතක් කරනව... "උන් කියනව, ජනතාවගෙ පරමාධිපත්‍ය බලය එහෙම යටකරන්න බෑලු. උන් දන්න පරමාධිපත්‍යය... මං කිවුව ඡන්දෙ දෙන්නත් රටක් තියෙන්න ඕනෙ කියල...!"

"ඉතින් ඒක කිවුවම සර්ට එළියට බහින්න වුණා..." මංජුව සිද්ධිය මනසෙ මවා ගන්න ගමන් ඇහුව.

"නෑ කතාව හින්ද මම එළියට බැස්සෙ නෑ..." පොලිටික්කගෙ තාමත් අබිමානෙ...

"එහෙනම් සර් තෙමුණෙ කොතෙන්දිද...?" හැමෝගෙම ප්‍රශ්නෙ වසන්තිය ඇහුව.

"තෙමුණෙ කොතෙන්දී... ලස්සන නම! කවුරු හරි පස්සෙ පෙළියකින් කිවුව.

"...අන්තිමට මුදලාලි මගෙ පැත්තට විට කාලා කට හෝදපු වතුර විසි කළා. ඒත් මං හිතුවෙ වැරදීමක් කියල. පස්සෙ මූණ දිහා බලල 'තූ විතරක්' කිවුවට පස්සෙ තමයි මම එළියට බැස්සෙ" පොලිටික්ක ස්වයං පාපෝච්චාරණයක් කළා.

"මං සර්ගෙ පරිස්සමට කියන්නෙ. දැන් ඉස්සර වගේ ඔය වගේ කතා මිනිස්සු ඉන්න තැන්වල කියන්න යන්න එපා. මිනිස්සු ඉන්නෙ ලොකු පීඩනේක. වෙඩි කාපු ඌරො වගේ. තමන් මේ විඳින දුකට හේතු වෙච්ච උන් වෙනුවෙන් සර් තාමත් පෙනී ඉන්නවා කියල එයාලට හිතන්නෙ ඇත්තෙ. ඉතින් තෙමිල විතරක් බේරෙන්න ලැබිච්ච එක ගැන සතුටු වෙන්න. අම්බානක් කන්නත් ඉඩ තිබුණා..." සමන ගෝලයෙකුට වගේ සර්ට කියනව.

"ගුටි කෑමට නියමිතයි... එහෙම නාට්ටියකුත් තිබුණා. සර් ගැනද දන්නෙ නෑ..." චමිය සද්දෙ වහල කියනකොටත් පොලිටික්ක කෝපි එකක් බොන්න කැන්ටිමට යන්න පිටත් වෙලා.

කවුළුව හැර තබමි

# අර්බුදය පැවැත්මේ කොන්දේසියක් කර ගැනීම...

කොලොන්නාවේ තෙල් ටැංකි සංකීර්ණයට එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රහාරයක් එල්ල කළ මොහොතේ සිවිල් සමාජ කතිකාව තුළ එය අර්බුදයක් විය. නමුත් ඒ ටැංකිවලින් පිටතට ගලාගෙන ගිය තෙල් එකතු කර මුදලක් හොයාගත් අයට එය අර්බුදයක් වූයේ නැත; තමන්ගේ පැවැත්මේ කොන්දේසියක් වූවා පමණි. අද ධනවාදය තුළ වන්නේද එයමය. අර්බුදය උලුප්පා කතා කිරීමම එහි පැවැත්මේ කොන්දේසියක් වී ඇත. තව අතකට කිවහොත් ආපදාව උලුප්පා කතා කිරීමම පැවැත්මේ කොන්දේසියක් වී තිබේ. එයට ආපදා ධනවාදය යනුවෙන්ද සමහරු ව්‍යවහාර කරති.


අද අපේ රටේ ධනේශ්වර ආණ්ඩු කරවන පාලකයින් විසින් කරමින් සිටින්නේද මෙයමය.

යුද්ධය පෙන්වා වරෙක සිය පැවැත්ම තහවුරු කරගත් පාලකයෝ වරෙක කොරෝනා වසංගත ආපදාව පෙන්වා එයම සිදු කළහ. දැන් අලුත්ම සෙල්ලම වන්නේ ආර්ථික අර්බුදය හා මුදල් හිඟය පෙන්වා ඡන්ද කල්දැමීමට උත්සාහ දැරීමය. යුද්ධයෙන්, කොරෝනාවෙන් පමණක් නොව මෙසා විශාල දරුණු ආර්ථික අර්බුදයකට සහ දරාගත නොහැකි ජීවන පීඩනයකට ජනතාව මුහුණ දී සිටියෙදී පවා මේ පාලකයන්ගේ කොල්ලකාරී ක්‍රියා පිළිවෙතේ නම් කිසිම අඩුවක් වී නැත. මැති ඇමති වරප්‍රසාද, දීමනා, වාහන වියදම් ඇතුළු සකල විධ නාස්තිකාර සහ ඒ මගින් ගෙනයන කොමිස්කාර, පගාකාර, චෞරකාර පිළිවෙත බිඳකිනුදු හකුළා ගෙන නැත.

ලැජ්ජා විරහිත පාලක රොත්තක් සහ ඉන්පසු තම අතට බලය ගැනීම සඳහා මෙම අර්බුදයම පාවිච්චි කරන චෞර රංගධරයන්ගේ ව්‍යාජයට අපේ රටේ ජනතාව නැවත වරෙක අසුවුවහොත් 'බබිත් සුං, බබීගේ අම්මාත් සුං'ම වන්නේය.




# පොල් කඩනවා, තැඹිලි බානවා, බස් එලවනවා, බෝල ගහනවා...




අපේ රටේ දේශපාලන පිස්සු කරත්තයක් මේ දිනවල කරන කියන දේවල් දුටු විට අපේ රටේ දේශපාලනය මෙතරම්ම ජෝක් වී මස්තබාල්දු වූයේ කෙසේදැයි හිතන මතන කෙනෙකු තුළ ඉමහත් පිළිකලක් සහ කළකිරීමක් ඇතිවීම නොවැළැක්විය හැකිය.

විපක්ෂ නායක පුතානෝ මේ කාලීන පිස්සුව හා බලයට කෑදරකමේ කරන කියන හාස්‍ය සහ තක්කඩිකම මිශ්‍ර රංගනයට මුලාවී ඔහු පසුපස ඇදී ගිය හොත් ලෝකාන්තයෙන් බිමට වැටුණා සේ මහත් බේදවාදකයකට ඇද වැටීමට, ලාංකේය පුරවැසියාට සිදුවේ. කිසිදු දේශපාලන දෘෂ්ටියක්, දැක්මක්, වැඩපිළිවෙළක් නැති මෙ පුත්‍රයාණෝ අමුතු අමුතු කතා කීමේ හපනෙකි.

මේ මෑතදී පැවති තම මහ සමුළුවේදී ඔහු කීවේ සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතාගේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය තමන් බලයට පත්වූ පසු ක්‍රියාත්මක කරන බවයි. ඊට පසු ඔහු තවත් අරුම පුදුම කතාවක් කියා තිබුණි. එනම් තමන් බලයට පැමිණියහොත් ලෝකයේ ණය දෙන රටවල් කැඳවා ණය සමුළුවක් පවත්වා ණය අරගෙන එම මුදල් රටේ දුප්පත් ජනතාවට බෙදා දෙන බවයි. මෙවැනි තොටළඟ පාඩම් කතා කීමට ඔහු හරිම රුසියෙකි.

ඡන්ද දායකයින් මොහුට රැවටී නැවත ලෝක අමාරුවක වැටේ යැයි අපි නොසිතමු. බැරි වෙලාවත් එසේ වුවහොත් රටේ ජනතතාවට සිදුවන්නේ ඊසොප්ගේ කතාවක එන 'රාවය' නමැති පිස්සු අසුපිටට නැගි තරුණයාට වූ දෙයමය.

"එක් තරුණයෙකු පිස්සු වැටුණු අසෙකු පිට නැග්ගේය. අශ්වයා හැරුණු හැරුණු අත හැල්මේ දුවන්නට විය. දැන් තරුණයාට ඌ පිටින් බහිනවා තබා කිසිවක් කර කියා ගත නොහැක.

දුවන අසුපිට නැග සිටි තරුණයා දෙස බලා සිටි එක් මිනිසෙකු 'ඔබ කොයිබට යන්නේ දැ'යි විමසා සිටි විට අශ්වයා පෙන්නූ තරුණයා කීවේ, මූට කැමති තැනකට යයි කියාය."


# මෙතෙක් කිසිවෙකුට හමුවීද ඔහු? ඔහු සොයා ගත යුතුම නොවේද අපි?

වෙලේ නියර දිගේ එද්දී හමන සුළඟේ මුදු සිසිලස විඳින්න. පුංචි දරුවෙකුගේ කිරි සිනහවක ආනන්දය විඳින්න. උදේ පාන්දර පිදුණු මලක සුන්දරත්වය දකින්න. මිනිසුන් ලෙස මනුෂ්‍යත්වයෙන් ගැබ්බර වෙන්න. මව් ගැබෙන් එළියට එන දරුවා ප්‍රේමයෙන් මුසපත්ව වැළඳ ගන්න.

දවස තුළ සතයක් වත් හොයා ගැනීමට නොහැකි වූ වීදි ගණිකාවක අතට රුපියල් පන්සීයක් දී අතේ ඉතුරු වූ රුපියල් පනහ හෙට දවසට ඉතිරි කරගෙන පයින්ම ගෙදර ඒම. මෙවැනි සිදුවීම් ලස්සන සාහිත්‍යමය භාෂාවකින් හිත හිරිවැටෙන විදියට ලියන එකත් මනුස්සකම නොවේද?

අපි සෑම දෙයක්ම මැදින් අල්ලා ගතහොත් මැදින් අල්ලා ගත් සෑම දෙයෙහිම දෙපසින් අපිට පහර දෙනු ඇත.

අපි සෑම අලුත් අවුරුද්දක් උදාවෙන දවසකම කෙතරම් එකිනෙකාට සුබ පතා ගන්නට ඇද්ද? ලෝකයේ තිබෙන සියලුම කඳු එකතු කර ගොඩනගන විශාලම කන්දට වඩා ලොකුම සුබ



පැතුම් කන්දක් ලාංකේය අප බෙදා ගන්නට ඇත.

එහෙත් අපිට අපේ දරුවාට වගේම තම දරුවා ජීවත් කරවීමට කිසිදු විකල්පයක් නැති අහිංසක දිළිඳු මවකගේ හද ගැස්ම මේ වසරේවත් අපිට දැනෙනු ඇත්ද? සැබෑම අලුත් අවුරුද්ද උපදිනුයේ එතැනය!

2022 දෙසැම්බර් 08

# ආර්ථික කඩාවැටීම හේතුවෙන් කර්මාන්තකරුවාත් විශ්‍රාමිකයාත් බරපතළ අර්බුදයක

*(2023 අයවැය තෙවැනි වර කියවීමේ විවාදයට සහභාගි වෙමින්)*

**ජාතික ජන බලවේගය පාර්ලිමේන්තු කණ්ඩායම් නායක**
**අනුර දිසානායක සහෝදරයා**

අපේ රටේ ආර්ථිකය ඉතාමත් ගැඹුරුතම අර්බුදයක ගිලී තිබෙන බව තවදුරටත් පැවසිය යුතු, නොදන්නා කරුණක් නොවෙයි. දැන් අර්බුදය සමනය වෙමින් තිබෙන බව ආණ්ඩුව ප්‍රකාශ කරන්නේ නම් එය ව්‍යාජයක්. මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී ඇති තරම් ඩොලර් ආදායම් තිබෙන බව ප්‍රකාශ කළා. ඩොලරය රුපියල් 203/- රඳවා ගන්නා අතර, 190/-ට වඩා අඩු මට්ටමකට ගෙනෙන බව එදා මුදල් ඇමතිවරයා කීවා. 2021 දෙසැම්බර් වෙන විට අපේ විදෙස් සංචිත ඩොලර් බිලියන 3 1/2ක් දක්වා වැඩිකරන බවත් කීවා. ඩොලර් බිලියන 33ක ආදායමක් උපයා ගන්නා බවටත් ඔහු වාර්තාවක් ඉදිරිපත් කළා. සත්‍ය කරුණු වසං කරමින් තමන්ම ස්වයං මෝහනයකට ලක්වෙමින් ජනතාවට ආමන්ත්‍රණය කරන ස්වභාවයක් තිබෙනවා. තෙල්, ගෑස් ආනයන භාණ්ඩ හිඟ නැති බවට හැඟවෙන කතා කියා තිබෙනවා. එහෙම කියන්නේ කුමන ආර්ථික ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් නිසාද?

විදෙස් ණය නොගෙවා ඉන්න බවට අප්‍රේල් 12වන දා තීරණය කළා. මේ සැප්තැම්බර් 30 වන විට විදේශ ණය නොගෙවීමෙන් ඩොලර් බිලියන 3.2ක් ඉතිරිව තිබෙනවා. QR සිස්ටම් එකට තෙල් දීමෙන්, කිරිපිටි, ගෑස් යම් තරමකට වෙළඳපොළේ තිබෙනවා. ගැඹුරුතම ආර්ථික ප්‍රතිඵලය ගැන නොදැනෙන්නේ මාර්තු මාසයේ විදේශ ණය, පොලී සහ වාරික ගෙවමින් තිබුණු භාණ්ඩ හිඟය ණය නොගෙවීම නිසයි. ණය ගෙවමින් භාණ්ඩ ආනයනය කළා නම්, මාර්තු මාසයට වඩා දරුණු තත්වයක් තිබෙන්නේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ ඇවිත් මාර වැඩක් කළා වගේ කතා කියන්න එපා. ආසන්න වශයෙන් පොහොර ගේන්න යන්නේ ඩොලර් මිලියන 60යි. ආසන්න වශයෙන් තෙල්වලට මාස හයකදී ඩොලර් මිලියන 2000කට වඩා අඩු වියදමක් යන්නේ.

## ව්‍යාපාරිකයින්ගේ අර්බුදය

මේ තත්වය තුළ ආර්ථිකයේ ඇතිවී තිබෙන ගැඹුරුතම අර්බුදය අනෙක් දිසාවන්ට ගමන් කරමින් තිබෙනවා. අපේ රටේ ආර්ථිකයේ කොඳු නාරටිය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්. පොලී අනුපාතිකයේ ඉහළ යාම විසින් ඔවුන් සියලු දෙනාට ණය ගෙවීමට නොහැකි වී තිබෙනවා. ඒ වගේම සමහර කර්මාන්තවලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කරන්න ඩොලර් නැහැ. ඒ නිසා අමුද්‍රව්‍ය හිඟතාවය විසිනුත් කර්මාන්ත අඩපණ වන අතර ආර්ථිකය හැකිළීම නිසා ඉල්ලුම අඩුවීමෙන් කර්මාන්ත බිඳ වැටෙනවා. සෘජු හා වක්‍ර රැකියා ලක්ෂ හතක් පමණ මේ වන විට අහිමිවී තිබෙනවා. මේසන් බාස්ගේ සිට සිවිල් ඉංජිනේරුවා දක්වා රැකියා අහිමිවී තිබෙනවා.

මේ ව්‍යවසායකයන්ට ණය සහන කාලයක් දෙසැම්බර් දක්වා ලබාදුන්නා. ජනවාරි සිට සිදුවන්නේ මොකක්ද? ඉඩකඩම් පවා අහිමි වී බැංකුවලට පවරා ගැනීමේ අනතුරක් තිබෙනවා. මේ කර්මාන්තවලින් යැපෙන සියලුම පවුල් විශාල තර්ජනයකට මුහුණ දෙනවා. මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. කර්මාන්තකරුවන් අතරින් 1% - 2%ක් පමණ හිතා මතා ණය පැහැර හරින අය ඇති. අද කර්මාන්ත කඩා වැටෙන්නේ ඔවුන්ගේ ගැටලුවක් නිසා නෙමෙයි; පාලකයන් විසින් ඇති කළ ආර්ථික ප්‍රතිවිපාක නිසයි. බැංකු තමන්ගේ ණය ආපසු අයකර ගන්න සමහර මැර කණ්ඩායම්වල සහාය අරගෙන තිබෙනවා, රිකවරි කම්පැනි කියලා. බැංකු



කොතනටද ගිහින් තිබෙන්නේ. ව්‍යාපාරිකයන් විශාල පිරිසක් සියදිවි නසා ගැනීමේ තත්වයට නැත්නම් ගැටුම් ඇතිවීමේ තත්වයකට පත්කර තිබෙනවා. පරණ දේපළ පවරා ගැනීමේ ක්‍රියාදාමය බැංකු විසින් වෙනස් කරන්න ඕනෑ. මංකොල්ලකාරයෝ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මම කතා කරන්නේ පිරිසිදු ව්‍යාපාරිකයන් ගැනයි. ආර්ථිකයේ කඩා වැටීම නිසා ඔවුන්ගේ ව්‍යාපාර කඩා වැටී තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් කඩා වැටුණොත් මුළු ආර්ථිකයත් ජන ජීවිතයත් කඩා වැටෙනවා. ලාංකේය ව්‍යාපාර බලගැන්වීමේ සංවිධානය විසින් මුදල් ඇමතිට, මහ බැංකු අධිපතිට, භාණ්ඩාගාර ලේකම්ට ලිපි යොමු කර තිබෙනවා. ඒ ගැන කිසි අවධානයක් යොමුකර නැහැ. ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

> ගැඹුරුතම ආර්ථික ප්‍රතිඵලය ගැන නොදැනෙන්නේ මාර්තු මාසයේ විදේශ ණය, පොලී සහ වාරික ගෙවමින් තිබුණු භාණ්ඩ හිඟය ණය නොගෙවීම නිසයි. ණය ගෙවමින් භාණ්ඩ ආනයනය කළා නම්, මාර්තු මාසයට වඩා දරුණු තත්වයක් තිබෙන්නේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ ඇවිත් මාර වැඩක් කළා වගේ කතා කියන්න එපා.

## වැටුප් අර්බුදය

විවිධ කාලවල රජය විවිධ බඳවා ගැනීම් සිදුකර තිබෙනවා. 2015දී ඩෙංගු මර්දන සහායට 1500ට ආසන්න ප්‍රමාණයක් බඳවා ගත්තා. 1100ක් පමණ දෙනා දැන් අවුරුදු හතරක් තිස්සේ රුපියල් 22,000/- වැටුපට වැඩ කරනවා. සාමාන්‍යපෙළ දක්වා ඉගෙන නැති දුප්පත් පවුල්වල අය 65,000ක් පමණ බහුකාර්ය දෙපාර්තමේන්තුවේ සේවයට යෙදවූවා. අවුරුදු දෙකකට ආසන්න කාලයක් ඔවුන්ටත් ලබාදෙන්නේ රුපියල් 22,000/-ක වැටුපක්. අද 22,000/-ක වැටුපකින් පවුලක් ජීවත් වන්නේ කොහොමද? නිල සංඛ්‍යා ලේඛන අනුව මාසයකට ජීවත් වෙන්න එක්ලක්ෂ හාරදහසක් අවශ්‍ය බව කියනවා. මේ රජය කුමන හෝ ප්‍රතිපත්තියක් මත බඳවා ගත් ඔවුන් ස්ථිර නොකර, වෘත්තීය අනාගතය පිළිබඳ සැලකිල්ලක් නොදැක්වීම ගැන අවධානය යොමු කළ යුතුයි.

## ණය අර්බුදය

විශේෂයෙන්ම හමුදාවේ අවුරුදු 40න් 42න් විශ්‍රාම ගිය සොල්දාදුවන් හට නිවාස ණය ලබාදීමට බැංකුවලින් විශේෂ වැඩසටහන් දියත් කර තිබුණා. ඒ අය විශ්‍රාම ගන්නවාත් සමගම රුපියල් ලක්ෂ 30ක පමණ ණයක් දුන්නා. ඔවුන්ගෙන් ණය අයකර ගැනීම ස්ථිර නිසයි එවැනි ව්‍යාපෘති දියත් කළේ. නමුත් දැන් ණයට අදාළ පොලිය විශාල ලෙස ඉහළ ගිය නිසා ඔවුන්ගේ මුළු වැටුපම බැංකුවට කැපෙනවා. පොලී අනුපාතිකය ඉහළ යාම නිසා එදාට වඩා වැඩි පොලී අනුපාතිකයක් අද අයකරනවා. සමහර අයට අතිනුත් රුපියල් 3000/-ක් ගෙවන්න සිදුවී ඇති බව අපට කියනවා. සාමාන්‍යයෙන් ආදායමෙන් හෝ වැටුපෙන් 60%ක ණය අයකර ගත හැකි ලෙසයි ණය දෙන්නේ. නමුත් ණය වාරික පොලිය විශාල වශයෙන් ඉහළ යාමෙන් දැන් මුළු වැටුපම ණය වාරිකයට කැපී යනවා. ආර්ථිකයේ ඇතිවී තිබෙන ගැඹුරුතම අර්බුදය සමහර සමාජ තීරුවලට බලපා ඇති ආකාරය ගැන මීට වඩා අවධානයක් මුදල් ඇමතිවරයාත් මේ ආණ්ඩුවත් යොමු කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

---

## පුද්ගලීකරණයඃ...

07 වැනි පිටුවෙන්

මෙම කාරණය පොදුය. එහෙත් අද නිදහස මෙන්ම සමානාත්මතාවන්ද වෙළඳපොළේ ඇති නිදහසට හැර වෙනත් තෙරුමක් අධිරාජ්‍යවාදී කොල්ලකෑම හමුවේ ඉතිරි කර නැත.

### ලංකාවේ නිදහස්කරණය හා අනාගතය

වත්මන් රනිල් වික්‍රමසිංහ පාලනයටද පෙර පාලක කණ්ඩායම් ලෙසින්ම රජය වෙළඳපොළ බැඳීම්වලින් නිදහස් වීමට යෝජනා කර ඇත. පාඩු හා ලාභ ලබන දෙයාකාර ආයතන විකිණීමට යෝජනා කිරීමත්, රාජ්‍ය සුබසාධන වියදම කප්පාදු කිරීමත් යෝජනා කරන්නේ සිය වුවමනාවන් අනුවය.

ලංකාව තුළ පුද්ගලීකරණය නියමිත යෝජනාවක් ලෙස ක්‍රියාවට නැගෙන්නේ 1987 අයවැය යෝජනා තුළිනි. නමුත් 1977ට පෙර සිටම ජාත්‍යන්තර මට්ටමින් රාජ්‍ය ආර්ථික ක්‍රියාවලියට මැදිහත්වීම අත්හැරීමේ පදනමට පසුබිම සකස් වෙමින් තිබුණි. 1977 නොවැම්බර් 16 ඉදිරිපත් කළ අයවැය මගින් පාවෙන විනිමය ක්‍රමය හඳුන්වාදීම. විනිමය පාලන නීති ලිහිල් කිරීම, මිල පාලනය ඉවත් කිරීම, විදේශ පෞද්ගලික ආයෝජන ආකර්ෂණ යෝජනා හඳුන්වා දීම, 1978 අංක 4 මහ කොළඹ ආර්ථික කොමිසමද පසුව 1988දී ඒ වෙනුවට මුළු රටටම අදාළ ලෙස ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය හඳුන්වා දීමද මේ විවෘතකරණයේ සංධිස්ථානයන්ය.

අද මෙන්ම පුද්ගලීකරණය ආරම්භ කළ මොහොතේ පටන්ම රාජ්‍ය ව්‍යවසායයන් විකිණීම මගින් ආණ්ඩු අපේක්ෂා කළ අරමුණු කිහිපයක් විය. ඒ අතර රජයේ වියදම මගින් අයවැයට සිදුවන පීඩනය අඩු කර ගැනීම, රජයට අමතර ආදායම ලබා ගැනීම මගින් අයවැය හිඟය පියවීම, පුද්ගලීකරණයෙන් ලැබෙන මුදල් මගින් රාජ්‍ය ණය ගෙවීම මගින් රාජ්‍ය ණය පීඩනය අඩුකර ගැනීම, රැකියා වියුක්තිය අඩුකර ගැනීම ඒ අතර වේ.

නමුත් විකිණීම (පුද්ගලීකරණය) ණය බර අඩුකර ගැනීමට හෝ අයවැය හිඟය පියවීමට අදාළ පිළිතුරක් ලබාදී නැති බව සංඛ්‍යා ලේඛන වගු දෙස බැලීමෙන් හොඳින් වටහා ගත හැකිය. වර්තමානයේදී ලාභ ලබන ආයතන විකිණීම විසින්ද පවතින අර්බුදයට තාවකාලිකව හෝ පිළිතුරක් නැති බව එම ආයතනවල වත්මන් ලාභය හා ගෙවීමට ඇති ණය සැසඳීමෙන් හොඳින් පැහැදිලි වේ.

ඒ නිසා විකිණීමේ වත්මන් අභිලාෂය බලයේ රැඳී සිටිමින්, ලෙඩා මලත් බඩ සුද්ද කිරීම හැර පාලකයින්ට විකල්ප විසඳුමක් නොවේ. දැන් ජනතාව තවදුරටත් විකිණීම පිළිතුරක් නොවන බව තේරුම් ගන්නවා පමණක් නොව ඒ මිථ්‍යාව පරාජය කර රට ගොඩනැගීමටද පියවර ගත යුතුව ඇත.

**ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - ලාභ සහ බදු** (රු.මි.)

| වර්ෂය | 2012 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|
| බදු ගෙවීම | 1905 | 1176 | 2183 | 1684 |
| ලාභ | 5244 | 7028 | 5788 | 10,041 |

## සමාජ වෙළඳපොළ...

09 වැනි පිටුවෙන්

ධනවාදයේ මුල් යුගයේදී නිදහස් තරගයට සමගාමීව පැන නැගී අධි නිෂ්පාදන අර්බුදයේ ප්‍රතිඵල විසින් එයට මුහුණ දීමට ඒකාධිකාර බිහිකර ඒකාධිකාරී ධනවාදය හෙවත් අධිරාජ්‍යවාදය බිහිවිය. දැන් පවතින්නේ අලුත් සමාජ ක්‍රමයක් නොව ධනවාදයේම ආකාරයක් ලෙස අධිරාජ්‍යවාදයයි. එයද යළි යළිත් අර්බුදයන්ට ලක්වන ආකාරය වරින් වර (වර්තමානයේදී නම් කාල සීමා රහිතව අඛණ්ඩවම) සිදුවන ධනවාදයේ චක්‍රීය අර්බුද විසින් ඔප්පු කෙරෙමින් තිබේ.

ඒකාධිකාර හෙවත් ධනවාදීන්ගේ අධිරාජ්‍යවාදී අවධිය පැවැත්මට එන්නේ 19 වැනි සියවසේ අගභාග යේ සිටය. එතැන් සිට මේ ගතවන 21 වන සියවස මුල කොටස දක්වාම වරින් වර විවිධ ආකෘති ඇති වෙමින් යළිත් නැති වෙමින් ලොව පුරා රටවල බලයට පත්වී ඇත්තේ මේ ධනේශ්වර නිෂ්පාදන මාදිලියම පවත්වාගෙන යන ධනපති පාලනයන්මය. ඉහතින් අප සාකච්ඡා කළ සමාජ වෙළඳපොළ ආර්ථික මොඩලයද කුමන නමින් නාමකරණය කළද මේ යළිත් ගොඩගත නොහැකි නිෂ්පාදනයේ සමාජමය සහ පුද්ගලික හිමිකාරිත්ව ගැටුම ජාන ලක්ෂණයක් ලෙසින් උරුම කරගත් ධනවාදයම හැර අන් පාලන ක්‍රමයක් නොවේ.

### අධිරාජ්‍යවාදයඃ මියැදෙන ධනවාදය

අප වර්තමානයේ ජීවත් වන්නේ මියැදෙන ධනවාදයේය. එහි තේරුම නම්, අධිරාජ්‍යවාදය ඓතිහාසික වශයෙන්ම අභාවයට යාමේ ස්වභාවයයි. ලෙනින්, මෙය මෙසේ ලිවීය. "ධනවාදයේ අධිරාජ්‍යවාදී යුගය ඉදී කුණු වූ ධනවාදයයි. එය බිඳවැටීමට නියමිතව ඇත. එය සමාජවාදයට මග හෙළි කිරීමට තරම් පරිණත වී ඇත." අධිරාජ්‍යවාදය යටතේදී සමාජවාදය සඳහා වන විෂය මූලික හා මනෝ මූලික පූර්ව කොන්දේසි පරිණත වීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර දමයි.

මේ නිසා ජනතාවගෙන් දිනපතා ප්‍රතික්ෂේප වෙමින් සිටින ධනපති පාලකයින් ජනතාව තව දිනයක් හෝ රවටා බලයේ සිටීම සඳහා තමන් මෙතෙක් කර තබාගෙන පැමිණි ධනවාදී ආර්ථික ක්‍රමයම කොතරම් දිරාපත් වෙමින්, විනාශ වෙමින් ගියද ඒ සඳහා අලුත් නම් යොදා ගනිමින් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරයි. ඒ අන් හේතුවක් නිසා නොව ඔවුන් සමාජවාදයට එරෙහි මියැදෙන ධනවාදය නියෝජනය කරන බැවිනි.

"අධිරාජ්‍යවාදය ධනවාදයේ වර්ධනීයම අවස්ථාවයි. එසේම එය විප්ලවීය ලෙස පෙරළා දැමීමද නොවැළැක්විය හැකිය. අධිරාජ්‍යවාදය ධනවාදයේ ඓතිහාසික අවධියයි. එය ඒකාධිකාරී ධනවාදයයි. පරපෝෂිත හා දිරාපත් වන ධනවාදයයි. මිය යමින් තිබෙන ධනවාදයයි. මිය යමින් තිබෙන ධනවාදය නැගී එන සමාජවාදයේ හිමිදිරියයි."

(ලෙනින් - අධිරාජ්‍යවාදය ධනවාදයේ ඉහළම අවධිය)

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



චීනයේ හිටපු ජනපති වියොවට සොව පළකර



ස්පාඤ්ඤයේ වාමාංශික පක්ෂ නියෝජිතයින් මුණගැසී




ස්වීඩනයේ වාමාංශික පක්ෂ හමුවී



බෙල්ජියමේ වාමාංශික පක්ෂ හමුවී



නෙදර්ලන්තයේ වාමාංශික පක්ෂ හමුවී



ජර්මනියේ ශ්‍රී ලාංකික සිසුන් සමග




# රට වෙනස් කිරීමේ ජයග්‍රාහී මාවත තෝරා ගත යුතුයි

## ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා



වසරකට රැකියා අපේක්ෂා කරන තරුණ තරුණියන් ලක්ෂ 03ක් රට තුළින් බිහිවුවත් මෙතෙක් බලයේ සිටි පාලකයන් නිසා සැලසුම් ක්‍රියාත්මක නොකිරීම නිසා මේ වන විට තරුණ ප්‍රජාව ඇතුළු ශ්‍රමිකයන් රට අත්හැර යාමේ විකල්පය තෝරාගෙන සිටින බවත් මෙතෙක් පාලකයින් විසින් අනුගමනය කරන ලද විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තියේ විපාක සමස්ත රටක් භුක්තිවිඳීම අවසන් කළ යුතුව ඇති බවත් ප්‍රකාශ කළ ජාතික ජන බලවේගයේ නායක අනුර දිසානායක සහෝදරයා, ඉක්මණින්ම රට වෙනස් කිරීමේ ජයග්‍රාහී මාවත තෝරා ගත යුතුව ඇති බව අවධාරණය කළේය.

ඔහු මේ බව කියා සිටියේ ජාතික ජන බලවේගය විසින් පසුගිය 23වැනි දින කුරුණෑගල නගරයේදී සංවිධානය කරන ලද රට විකුණන, ජනතාව මර්දනය කරන, ජනපීඩක ආණ්ඩුවට එරෙහි ජන බල විරෝධතා රැලිය අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් පළ කරමින් අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ වනවිට රට හෙළා තිබෙන විනාශය නිසා පසුගිය මාස 08ක් තුළ හයලක්ෂ විසිපන්දහසක් දෙනා රටින් පිටවීම සඳහා පාස්පෝට් ලබාගෙන තිබෙනවා. නමුත් විදේශ රැකියා වෙනුවෙන් රටින් පිටව ගොස් ඇත්තේ එක්ලක්ෂ පනස් දහසක් පමණයි. සංචාරක වීසා මගින් විදේශගත වූ හතළිස් දහසක් පමණ දෙනා මේ වනවිට අනාරක්ෂිතභාවයට ගොදුරුවී ආරක්ෂිත නිවස්නවල ගත කරමින් සිටිනවා. එසේ විදේශගත වූ මවුවරුන් සහ සහෝදරියන් පිරිසක් ඕමානයේදී ගණිකාවන් ලෙස වෙන්දේසි කරනු ලැබුවා. මෙම ඛේදජනක තත්වය අවසන් කළ හැක්කේ ජාතික ජන බලවේගයේ ජනතාවාදී පාලනයක් පිහිටුවා ගැනීමෙන් පමණයි.

මේ වනවිට රටේ පවතින සැබෑ තත්වය වසං කරමින් විවිධ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කෙරෙමින් තිබෙනවා. එසේ ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛනවලින්ද ආහාර උද්ධමනය 95%ක් බව හෙළි වී ඇති නමුත් සාමාන්‍ය ජනතාවගේ ආදායම් හෝ මාසික වැටුප් ලබන්නන්ගේ පඩිපත වැඩි වී නැහැ. පුරවැසියන් විශාල ආහාර හිඟයකට ගොදුරු කර තිබෙනවා."

# රටේ ඉතිහාසයේ පළමු වතාවට ජනතාවගේ බලයක් පිහිටුවන්න සූදානම්

## ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



රනිල් වික්‍රමසිංහලාට සහ රාජපක්ෂ පාලට තිබුණු බලය අවසන් වී ඇති බවත් දැනට කුඩා බලයක් පාර්ලිමේන්තුවේ සහ ව්‍යවස්ථාවේ පමණක් ඉතිරි වී තිබුණද මහජන බලය හමුවේ එයද අවසන් වන බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, රටේ ඉතිහාසය අලුතින් ලිවීමට පෙළගැසෙන ජනතාව පළමු වතාවට ජනතාවාදී පාලනයක් පිහිටුවීම සඳහා පෙළගැසෙමින් සිටින බව ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව අවධාරණය කළේ පසුගිය 23වැනිදා කුරුණෑගල පැවති ජනපීඩක ආණ්ඩුවට එරෙහි ජන බල විරෝධතා රැලිය අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද කියා සිටියේය.

"තම බලය අවසන්වෙමින් එන බව දැන දැනත් ආණ්ඩුව පොලිසිය යොදවා මහජන පෙළගැස්මට කුඩා අවහිරකම්, බාධා එල්ල කරනවා. එහෙත් එවැනි දේ සාර්ථක කරගන්න බැහැ. මෙයට පෙර එවැනි බාධා කිරීම් කළ හැකි වූ ආරක්ෂක අංශ පවා මේ වනවිට මහජන බලවේග සමග එකතු වී තිබෙනවා.

ඇත්ත බලය තිබෙන්නේ මහ පාරේ ජනතාව තුළයි. මේ වනවිට රට විනාශ කළ කල්ලිය එක පැත්තකට දමා රට ගොඩනැගීමට සූදානම් ජනතාව ජාතික ජන බලවේගය වටා එක් වී මේ රටේ ඉතිහාසය අලුතින් ලියමින් සිටිනවා. මේ ජනතාව ජනතාවාදී පාලනයක් වෙනුවෙන් පෙළගැසෙමින් මේ වනවිට පවතින ආර්ථික පීඩනයන් ඇතුළු සියලු පීඩාවන්ට එරෙහිව අරගල කරමින් පෙරට යමින් සිටිනවා. ඒ ගමන කිසිවෙකුටත් නතර කළ නොහැකියි."

# රැලිය වළක්වන්න පොලීසියට බලපෑම් ආවත් ආරක්ෂක අංශ බහුතරය අපිත් එක්ක

## ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික නාමල් කරුණාරත්න සහෝදරයා

ජාතික ජන බලවේගයේ විරෝධතා රැලිය වැළැක්වීමට ආණ්ඩුව පොලිසිය හරහා විවිධ බලපෑම් සිදු කළත් එය වැළැක්වීමට තක්කඩි ආණ්ඩුවට නොහැකි වූ බවත් පොලීසිය සහ ත්‍රිවිධ හමුදාවේ අති බහුතරය මේ වනවිට ජාතික ජන බලවේගය සමග එක් වී සිටින බවත් සමස්ත ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික, ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න සහෝදරයා පැවසීය.

මේ වනවිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොට්ඨාස සභා 650ක් පිහිටුවා අවසන් බවද සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනා ජාතික ජන බලවේගය වටා එකතුවෙමින් ජනතාවාදී නව පාලනයක් පිහිටුවා ගැනීමට සූදානම් වෙමින් සිටින බවද ප්‍රකාශ කළ නාමල් කරුණාරත්න සහෝදරයා, එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධව සිටි බහුතරයත් පොහොට්ටුවේ සියලුම දෙනා පාහේත් අද වන විට එක් වෙමින් සිටින්නේ යැයිද, සජිත්ගේ කණ්ඩායම, ෆොන්සේකා, චම්පික රණවක වශයෙන් කොටස් තුනකට බෙදී ඇති බවද අනාවරණය කළේය.



බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.